# ආබාධිතබව පිළිබඳ

# ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය

## සමාජ සේවා අමාත්‍යාංශය

සෙත්සිරිපාය
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

2003 අගෝස්තු

# පටුන

*පෙරවදන* 5

*ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ හැඳින්වීම* 6

*ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය* 8

*පළමුවන කොටස – ප්‍රතිපත්ති සැකසුම සඳහා බලපාන්නා වූ පැ හේතු සාධක* 9

I ප්‍රතිපත්තියේ විෂය පථය

1 ආබාධිත බව පිළිබඳ විග්‍රහය සහ එහි ඇඟවීම් 10
2 ඉලක්ක කණ්ඩායම් 11

II සමාජ-ආර්ථික කරුණු 12

1 ආදායම 12
2 රැකියාව 13
3 වෘත්තීය නිපුණතා 15
4 අධ්‍යාපනය 17
(1) ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය 17
(2) නොවිධිමත් අධ්‍යාපනය 24
(3) උසස් අධ්‍යාපනය 24
5 නිවාස 24
6 පොදු සේවා භාවිත කිරීම
(1) සෞඛ්‍ය 24
(2) සමාජ සේවා 25
7 කොන් කරන ලද කණ්ඩායම තුළ කොන් කරන ලද කණ්ඩායම්
(1) ආබාධ ඇති කාන්තාවෝ 25
(2) ආබාධ ඇති ළමුන් 26
(3) බුද්ධිමය ආබාධ ඇති තැනැත්තන් 27
(3) මානසික ආබාධ ඇති තැනැත්තන් 28
(4) බරපතළ හා බහුවිධ ආබාධ ඇති තැනැත්තන් 28
8 සාරාංශය: ආබාධිතබව, දිළිඳුබව සහ සමාජයෙන් බැහැර කිරීම 29

III අන්තර්කරණයට බාධක 30

1 පාරිසරික සහ ප්‍රවාහන ප්‍රවේශ පහසුකම්වලට බාධක 30
2 සන්නිවේදක බාධක 30
3 සංස්කෘතික බාධක 32
4 ආධාරක උපකරණ 32
5 සමාජයේ සහ පවුල්වල අපේක්ෂා 33

IV ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගත හැකි සම්පත් 35



3 – CM 016506

*දෙවන කොටස – මූලධර්ම, ප්‍රතිපත්ති සහ උපාය මාර්ග* **36**

V ප්‍රතිපත්ති මූලධර්ම 37

*VI අංශ පිළිබඳ ප්‍රතිපත්ති සහ අන්තර්කරණය සඳහා උපාය මාර්ග* *38*

| | | |
|---|---|---|
| 1 | රැකියා | 38 |
| 2 | වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය | 40 |
| 3 | දිළිඳුබව දුරලීම | 41 |
| 4 | පාසල් අධ්‍යාපනය | 41 |
| 5 | නොවිධිමත් අධ්‍යාපනය | 46 |
| 6 | උසස් අධ්‍යාපනය | 46 |
| 7 | සෞඛ්‍ය | 47 |
| 8 | ක්‍රීඩා | 47 |
| 9 | ප්‍රවාහනය | 48 |
| 10 | නිවාස | 50 |
| 11 | සමාජ ආරක්ෂණය | 51 |
| 12 | ගොඩනැගූ පරිසරයට ප්‍රවේශ පහසුකම් හා ප්‍රවේශ පහසුකම් සහිත සංචාරක ව්‍යාපාරය | 51 |
| 13 | සන්නිවේදනයට සහ තොරතුරුවලට ප්‍රවේශය | 53 |
| 14 | ආධාරක උපකරණ සහ තොරතුරු තාක්ෂණය | 54 |
| 15 | ළමුන් | 55 |
| 16 | තරුණ පුද්ගලයන් | 57 |
| 17 | කාන්තාවෝ | 58 |
| 18 | වියපත් පුද්ගලයන් | 59 |
| 19 | ..ා ගැ..ම්වල ..ෙ පැමිට ..කඩුවත් | 60 |
| 20 | බරපතල ආබාධ සහිත තැනැත්තන් | 61 |
| 21 | ජන මාධ්‍ය | 62 |

**VII සාකල්‍ය ක්‍රියාත්මක කිරීමක් සහතික කරලීම පිණිස ප්‍රතිපත්ති සහ උපාය මාර්ග**

| | | |
|---|---|---|
| 22 | ප්‍රජා මූලික පුනරුත්ථාපනය | 63 |
| 23 | රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය | 64 |
| 24 | පර්යේෂණ | 64 |
| 25 | ව්‍යවස්ථා සම්පාදනය | 64 |
| 26 | ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ ඇගැයීම | 65 |

**VIII** ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවෝ 66

*උපලේඛනය:* කෙටුම්පත් කිරීමේ කමිටුවේ සාමාජිකයෝ 71

# පෙරවදන

සමාජ සේවා අමාත්‍යාංශය වසර කීපයක් තිස්සේ ජාතික ප්‍රතිපත්තියක් නොමැතිව ආබාධිතතා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක විය. 1996 අංක 28 දරණ පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගනු ලැබුවේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් නෛතිකව බලගැන්වීම පිණිසය. සමාජ සුභසාධන ගරු අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් ජාතික සභාවක් පිහිටවනු ලැබුවේ ද ආබාධිතතා පිළිබඳ කරුණුවලදී වගකීම දරමින් අවශ්‍ය කටයුතු ඉටු කිරීමටය.

සමාජ සේවා ගරු අමාත්‍යවරයා ආබාධිතතා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක ඇති වැදගත්කම පසක්කොට, 2003 දී ප්‍රතිපත්ති කෙටුම්පත් සකස්කරනු සඳහා කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ සභාපතිත්වය උසුලනු ලැබුවේ ආචාර්ය පද්මිණී මෙන්ඩිස් මහත්මියයි. මෙම කමිටුවේ කාර්යභාරය වූයේ අප සැමටම සතුටුවිය හැකි ආබාධිතතා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමය. මෙම ජාතික ප්‍රතිපත්තිය ආබාධිතතා ක්ෂේත්‍රයේ නියැළි සියල්ලන්ටම ඉමහත් පිටිවහලක් වනු ඇත.

මේ අනුව, 2003 අගෝස්තු මාසයේ දී මෙම ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එය මුද්‍රණාද්වාරයෙන් නිකුත් කරන ලදී. මෙරට ආබාධ සහිත ප්‍රජාවගේ ඉදිරි දිවිය සැපවත් කිරීමට මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු කිරීම අප සියළු දෙනාගේ වගකීමත් වේ. ඒ සඳහා සියළු දෙනාගේ දායකත්වය අපේක්ෂා කරමි.

**ඩබ්. යමුනා චිත්‍රාංගනී**
**ලේකම්**

# කෙටුම්පත් කිරීමේ කමිටුව විසින් ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ හැඳින්වීමක්

ආබාධිත බව පිළිබඳ ප්‍රතිපත්තියක් සකසන මෙන් වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ ආබාධිතබව පිළිබඳ ව්‍යාපාරය විසින් රජයෙන් ඉල්ලා සිටින ලදී. ආබාධ ඇති තැනැත්තන්ගේ තත්ත්වය වෙනස් කරන්නා වූ සමාජ සංවර්ධන ක්‍රියාවලියට උත්තේජනයක් සහ ශක්තියක් සපයනු ලැබීම සඳහා ඉතා මූලික වන්නා වූ දෙයක් ලෙස ඔවිහු ප්‍රතිපත්තිය දුටහ. තම අයිතිවාසිකම් සහ වගකීම් ක්‍රියාත්මක කිරීමට ඔවුනට හැකියාව ලබා දෙන, තිබෙන සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කරන්නා වූ සහ සමාජ ආර්ථික ප්‍රධාන ධාරාවට ආබාධ ඇති තැනැත්තන් ඇතුල් කරන්නා වූ පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැතිකම මේ දක්වා. වැඩසටහන් තිරසාරව පවත්වාගෙන යාමට බාධක ව පැවතිණි. මේවා අනෙක් අතට, ඔවුන්ගේ තත්ත්වයට කිසිදු හෝ සැලකිය යුතු ආකාරයේ බලපෑමක් නොකිරීමට හේතු විය.

ආබාධිත බව පිළිබඳ ව්‍යාපාරයේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින්, ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම සඳහා ගරු සමාජ සුභසාධන අමාත්‍යවරයා විසින් කමිටුවක් පත් කරන ලදී. ආබාධිත බව පිළිබඳ ව්‍යාපාරය විසින් ප්‍රකාශ කරන ලද අදහස් අනුව, එවැනි ජාතික ප්‍රතිපත්තියක් අයිතිවාසිකම් පදනම් කර ගත් හා සම්පත් පදනම් කර ගත් එකක් වීම අවශ්‍ය කෙරේ. මෙය අනික් අතට ආබාධිත බව විශාල පරිමාණයන්ගෙන් යුත් පැතිකඩක් බවට පත් කරයි.

මෙම ඉල්ලීම් සපුරාලීම සඳහා ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේ කමිටුව තුළ සියලු ප්‍රධාන වර්ගයේ ආබාධ, සියලු වයස් කණ්ඩායම්, රජය, රාජ්‍ය නොවන සංවිධාන, නීතිය, මානව හිමිකම් සහ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ ක්ෂේත්‍රවල විශේෂඥ භාවය නියෝජනය කරන්නා වූ සාමාජිකයන්ගේ පැතිකඩක් නියෝජනය විය.

කෙසේ වුව ද, ප්‍රතිපත්තියේ ශක්තිය රැඳී පවත්නේ එහි සංවර්ධනය සඳහා යොදා ගන්නා ලද ක්‍රියාවලිය තුළ ය. මෙය අත්‍යවශ්‍යයෙන් ම සහභාගිත්ව ක්‍රියාවලියක් විය. අදහස් විමසීමේ ක්‍රියාවලියක් සඳහා සමාජ සුභ සාධන අමාත්‍යාංශය විසින් වෙනත් අදාල රජයේ අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ එක්සත් ජාතීන්ගේ සහ අන්තර්ජාතික නියෝජිත ආයතනවල සහයෝගය ඉල්ලා සිටියේ ය. සුවිශේෂී ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් එක් එක් අංශය සමග වෙනම රැස්වීම් පවත්වන ලදී. ආබාධ ඇති තැනැත්තන් සහ ඔවුන්ගේ සංවිධානවලට මෙන් ම මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මගින් කරන ලද බොහෝ දැන්වීම් සහ නිවේදන මගින් සිවිල් සමාජය සහ සාමාන්‍ය ජනයාට ද සහභාගී වීම සඳහා ඉඩප්‍රස්ථා සළසන ලදී.

කුමන ආකාරයකින් හෝ සහභාගී වූ සහ දායක වූ සැමගේ අදහස් හා නියෝජනයන් ප්‍රතිපත්තිය සැකසීමේ දී සැලකිල්ලට ගන්නා ලදී.

ජාතික ප්‍රතිපත්තිය කොටස් දෙකකින් සමන්විත වෙයි.

පළමු කොටස ප්‍රතිපත්ති සැකසීම සඳහා පාදක වූ කරුණු, එහි විෂය පථය, එයට පදනම් වූ සමාජ ආර්ථික කරුණු, ආබාධ ඇති තැනැත්තන් සමාජ ආර්ථික ප්‍රධාන ධාරාවෙන් බැහැර කරන බාධක සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගත හැකි සම්පත් ඉදිරිපත් කරයි. ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී සැලකිල්ලට ගන්නා ලද තත්ත්වය වූයේ මෙයයි.

දෙවන කොටසින් ප්‍රතිපත්ති රාමුව සකසන මාර්ගෝපදේශක මූලධර්ම ප්‍රථමයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, එය එම මූලධර්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට හා එක්සත් ජාතීන්ගේ වෙනත් සාධන පත්‍රවලට සම්බන්ධ කරයි. ඉන්පසු එය අදහස් විමසීමේ ක්‍රියාවලියේ දී හඳුනා ගන්නා ලද ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 26 ක් විස්තර කරයි. එක් එක් ප්‍රතිපත්තිය සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන කරනු ලබන අතර ඒවා සපුරා ගැනීම සඳහා උපාය මාර්ග ද දක්වා ඇත.

ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ ඇගැයීම සඳහා යාන්ත්‍රණවල අවශ්‍යතාව ප්‍රතිපත්තිය මගින් අවධාරණයකොට යෝජනා කරනු ලබන අතර, ප්‍රතිපත්තියේ විවිධ අංශ සඳහා වගකීම දරන අමාත්‍යාංශවල ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

ආබාධිතබව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීම සම්බන්ධව කෙටුම්පත් කමිටුව ප්‍රසාදය පළ කර සිටී.

Padmani Mendis

ආචාර්ය පද්මණී මෙන්ඩිස්
සභාපතිනිය

එච් පී එන් ලක්ෂ්මන් මහතා

Lakmali Cabral

ලක්මාලි කබ්රාල් මිය

මහාචාර්ය තාලක මෙන්ඩිස්

Galekotuwa

පී ගලේකොටුව මහතා

ඩබ් එච් ඩබ් සොයිසා මහතා

එස් එල් හෙට්ටිආරච්චි මහතා

Siriwardane

සිරිල් සිරිවර්ධන මහතා

අනිල් ජයවර්ධන මහතා

ජ්. එම්. ජී. තිලකරත්න මහතා

M. G. Kamalawathie

එන් ජී කමලාවතී මිය

සමුණා චිත්‍රාංගනී මිය
කමිටුවේ ලේකම්

## ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය

ආබාධිතබව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාජ යුක්තියේ නාමයෙන් ආබාධ ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම කරයි. ඔවුනට සමාන පුරවැසියන් මෙන් පූර්ණ සහ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමේ සහ සිය දැනුම, අත්දැකීම් සහ සුවිශේෂී නිපුණතා සහ හැකියාවන් ජාතික සංවර්ධනය සඳහා දායක කිරීමේ ඉඩ ප්‍රස්ථා ලැබෙනු ඇත

## පළමු කොටස

# ප්‍රතිපත්ති සැකසුම සඳහා බලපාන්නා වූ හේතු සාධක

# I ප්‍රතිපත්තියේ විෂය පථය

## 1 ආබාධිත බව පිළිබඳ විග්‍රහය සහ එහි ඇගවීම්

ශ්‍රී ලංකාවේ ආබාධිතබව පිළිබඳ නෛතික විග්‍රහය ආබාධ ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පණතේ අඩංගු වේ.[1] "ආබාධ ඇති තැනැත්තකු යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌණතාවක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවන් මුලුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහාම ඉටු කර ගැනීමට නොහැකි යම් තැනැත්තෙකු" අදහස් වේ. මෙය වූකලී ආබාධ සහිත බවේ වෛද්‍යමය හා සමාජ - ආර්ථික අංගයන් ඇතුලත් වන්නා වූ සාධාරණ වශයෙන් පුලුල් වූ විග්‍රහයකි.

ආබාධිතබව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින්, එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් කරගෙන යාමේ දී පුද්ගලයන් මත පැණවී ඇති සීමාවන් සහ දෛනික ජීවන කටයුතුවල සහභාගිවීම මත පැණවී ඇති සීමාවන් සැලකිල්ලට ගනී. ජීවිතයේ අවශ්‍යතාවන් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් තමාට කර ගත හැකි බව තමාට සහතික කර ගත නොහැකි ආබාධ ඇති තැනැත්තන් කෙරෙහි මෙම සීමාවන් සහ වෙනත් පෞද්ගලික හා පාරිසරික සාධක බලපෑම් ඇති කරයි. මෙය වූකලී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉතාමත් මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද ආබාධිතබව පිළිබඳ වර්ගීකරණයේ දී දරණ ලද මතයයි.[2] අබාධ සහිත බව යනු පුලුල් ක්ෂේත්‍රයක එක් එක් පුද්ගලයාගේ තත්ත්වය විස්තර කිරීම සඳහා යොදා ගනු ලබන ඡත්‍ර වදනක් වන අතර, පෞද්ගලික සහ පාරිසරික සාධකවල සන්දර්භයක් තුළ එය භාවිත කරනු ලබයි. පාරිසරික සාධක යනු පුද්ගලයාට බාහිරව පවතින සාධක වන අතර මිනිසුන් ජීවත් වන්නා වූ හා සිය ජීවිතය පවත්වාගෙන යන්නා වූ භෞතික, සමාජ සහ ආකල්පමය වාතාවරණය සකස් කරන ඒවා වේ. මේවා කෙරෙහි අනෙක් අනට සංස්කෘතික හා ආගමික භාවිතාවන් හා ඇදහිලි බලපායි.

වර්තමාන කාලයේ සහ නුදුරු අනාගතයේ දී ආබාධිතබව සම්බන්ධ සියලු කරුණුවල දී එවැනි අර්ථ නිරූපණයක් යොදා ගැනීම අවශ්‍ය වනවාක් මෙන් ම අවශ්‍ය වනු ද ඇත. යම් පුද්ගලයෙක් යම් ක්‍රියාකාරකම් කරගෙන යාමේ දී මුහුණ පාන්නා වූ හෝ සිය දෛනික ජීවිත තත්ත්වයන්හි සහභාගී වීමේ දී අත්දකින්නා වූ සීමාවන් ඒවායේ සන්දර්භය තුළ දැකිය හැකි වන්නේ හෝ අවබෝධ කර ගත හැකි වන්නේ එවිට පමණි.

පෞද්ගලික සාධක යනු පුද්ගලයාගේ වයස, ස්ත්‍රී පුරුෂ බව, සෞඛ්‍ය තත්ත්වය, පෞරුෂත්වය, ජීවන රටාව. අත්දැකීම් හා සම්බන්ධ ඒවා වන අතර ආබාධිතබව කෙරෙහි අදාල පුද්ගලයා ප්‍රතිචාර දක්වන ආකාරය කෙරෙහි ඒවා බලපෑමක් ඇති කරයි.

සමාජ සාධකවලට නිදසුනක් වශයෙන්, ආබාධ ඇති තැනැත්තන් යනු වෙනත් වර්ගයක පිරිසක් වශයෙන් දකින්නා වූ, ඔවුන් සමාන මානව අයිතිවාසිකම් හා වගකීම් ඇති සමාන මිනිසුන් ලෙස නොදකින්නා වූ, වෙනත් පුද්ගලයන්ට ලබා ගත හැකි සමාන අවස්ථා ඔවුන්ට ද ලබා නොදෙන්නා වූ, සහ සිය ආබාධිතබව නිසා ආබාධ ඇති තැනැත්තන් ප්‍රධාන සමාජ ධාරාවෙන් බැහැර කරන්නා වූ, අනෙක් පුද්ගලයන්ගේ හා සමාජයේ ආකල්ප අයත් වේ.

---

1 Parliament of Sri Lanka: *Protection of the Rights of Persons with Disabilities Act, No 28 of 1996*

2 World Health Organization: *International Classification of Functioning, Disability and Health (ICF),* WHO Geneva, 2001

සංස්කෘතික සාධකවලට, ආබාධිතබව සහ ආබාධ ඇති තැනැත්තන් අවාසනාව හා සම්බන්ධ කරමින් සහ ඔවුන් අවාසනාවේ පෙර නිමිති ලෙස දකිමින් අපේ සමාජය පුරා පැතිර ගොස් ඇති බොහෝ මිත්‍යා විශ්වාස අයත් වේ.

ජීවිතයේ අවශ්‍යතාවන් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් තමාට කර ගත හැකි බව තමාට සහතික කර ගැනීමෙන් පුද්ගලයන් වලක්වන පාරිසරික හා භෞතික බාධකවලට, රෝද පුටු පාවිච්චි කරන්නන් සහ දෘශ්‍යාබාධිත තැනැත්තන් වැනි අයට ගොඩ නගන ලද පරිසරයට සහ අවශ්‍ය වන්නා වූ ආධාරක උපකරණවලට ප්‍රවේශ පහසුකම් නොතිබීම අයත් වේ. වෙනත් අයට මෙන් ශ්‍රවණය කිරීමේ හැකියාවක් නොමැති සහ/හෝ කථා කිරීමේ හැකියාවක් නොමැති අයට සන්නිවේදනය කෙරෙහි ප්‍රවේශ පහසුකම් නොමැතිවීම ද එයට අයත් වේ. එසේම අපස්මාරය නිසා හෝ සිය මානසික වර්ධනය ප්‍රමාද වීම නිසා හෝ මන්දගාමී වීම නිසා හෝ අසනීපයක් හෝ සිය මානසික කාර්යයන් අඩාල වීම නිසා අන්‍යයන්ට මෙන් අවබෝධ කර ගැනීමේ හෝ හැසිරීමේ හැකියාව නොමැති පුද්ගලයන්ට අධ්‍යාපනයට සහ පොදු සේවාවන් සඳහා ප්‍රවේශ පහසුකම් නොලැබීම ද එයට අයත් වේ. ආර්ථික, අධ්‍යාපනික, සමාජ, සිවිල්, සංස්කෘතික, විනෝදාත්මක, ආගමික සහ දේශපාලනික ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් මෙම පුද්ගලයන් සීමා කිරීමක් සංස්කෘතික බාධකවලින් සිදු වේ. මෙම බාධකවලට ආධාරක වශයෙන් පවත්නාවූ කරුණු කෙරෙහි ජාතික ප්‍රතිපත්තිය මගින් අවධානය යොමු කරනු ලැබේ.

## 2 ඉලක්ක කණ්ඩායම්

වැඩසටහන් සංවර්ධනය සඳහා සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් යොදා ගන්නා ආබාධ සහිත බව පිළිබඳ වර්ගීකරණයට, දෘෂ්‍ය, කථන, ශ්‍රවණ, චලන, බුද්ධිමය සහ මානසික ආබාධ සහ අපස්මාරය හා වෙනත් හේතු නිසා ඇතිවන ආබාධ ඇතුලත් වේ. එසේ ම තනි පුද්ගලයෙකු තුල ආබාධ එකක් හෝ එයට වැඩි ගණනක සංයුතියකින් ඇතිවන බහුවිධ ආබාධ ද එයට ඇතුලත් වේ.

දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ සිදු වෙමින් පවතින සිවිල් ගැටුම නිසා සටන්කරුවන් මෙන්ම සිවිල් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් ද තුවාල හා ආබාධවලට ලක් වී ඇත. මෙම ප්‍රතිපත්තියේ විෂය පථය තුළ ඔවුන්ගේ අවශ්‍යතා ද සැලකිල්ලට ගනු ලැබ ඇත.

ආබාධිතබව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් විවිධ වර්ගයේ ආබාධ ප්‍රකාශ වන, ඕනෑම වයසක පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි බලපාන කරුණු කෙරෙහි ද අවධානය යොමු කරයි. කවර හෝ වයසක හෝ ආබාධයකින් යුත් ස්ත්‍රී පුරුෂයන් අතර සාධාරණතාව වර්ධනය කිරීම හා සම්බන්ධ කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබ ඇත.

# II සමාජ ආර්ථික කරුණු

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු සැපයීම පිණිස සමාජ සුබසාධන අමාත්‍යාංශය විසින්, ආබාධ ඇති වැඩිහිටි පුද්ගලයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය තීරණය කිරීම සඳහා සමාජ සමීක්ෂණ අධ්‍යයනයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම අධ්‍යයනය 2003 පෙබරවාරි මාසයේ දී සිදු කෙරිණි. 541 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන නියැදියට පුද්ගල කණ්ඩායම් 7 ක්, එනම් දෘෂ්‍ය, කථන, ශ්‍රවණ, චලන, බුද්ධිමය සහ මානසික ආබාධ සහ අපස්මාරය නිසා ඇතිවන ආබාධ ඇති වැඩිහිටියන් ඇතුළත් කර ගන්නා ලදී. මෙම ආබාධ ඇති ළමුන් ද සමග මේ සියලු දෙනා මෙම ප්‍රතිපත්තියේ ඉලක්ක කණ්ඩායම බවට පත් වෙති.

ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ දී පූර්ව අවශ්‍යතාවක් වන්නා වූ තොරතුරු, එනම් මෙහි දී ආබාධ ඇති පුරවැසියන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයන්නා වූ, ශ්‍රී ලංකාව තුළ මේ දක්වා කරන ලද එකම අධ්‍යයනය මෙය වේ. වෙනත් අයුරකින් සඳහන් කර ඇති කරුණු හැරෙන්නට, මෙම ලේඛනයේ සඳහන් දත්ත මෙම අධ්‍යයනයෙන් ලබා ගත් ඒවාය.[3]

## 1 ආදායම

රැකියාවක නියුක්ත, එහෙත් දිනකට ඇමරිකානු ඩොලර් 1.00 ක ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවෙන් පහළ ආදායමක් ලබමින් ජීවත් වන පුද්ගලයන් අධ්‍යයනයේ පුද්ගල කණ්ඩායම් 5 ක් තුළ විවිධාකාරයෙන් නියෝජනය වූහ. එහි 43% ක් වූ පහළ ප්‍රතිශතයක බුද්ධිමය ආබාධ ඇති තැනැත්තන්ගේ සිට 45% ක් වූ චලන ආබාධ ඇති තැනැත්තන් ද, 72% ක් මානසික ආබාධ සහිත තැනැත්තන් ද, 81% ක් වූ ශ්‍රවණ ආබාධ ඇති තැනැත්තන් ද සහිතව, 88% ක ඉහළ ප්‍රතිශතයක කථන ආබාධ ඇති තැනැත්තන් දක්වා පරාසයක පුද්ගලයෝ වූහ.

රැකියාවක නියුතු මානසික ආබාධ ඇති තැනැත්තන්ගේ හා අපස්මාරයෙන් පෙළෙන පුද්ගලයන්ගේ ආදායම් මට්ටම මිණිය නොහැකි විය. ඔවුන්ගේ සේවා නියුක්ති අනුපාතය පිළිවෙළින් 1% ක් හා 5% ක් විය.

දිනකට ඇ ඩො 2.00 ක ගෘහස්ත ආදායම පිළිබඳ සංඛ්‍යා ද යහපත් නොවීය. එය බුද්ධිමය ආබාධ සහිත පුද්ගලයෙන් සඳහා 84% ක සිට මානසික ආබාධ ඇති තැනැත්තන් සඳහා 85% ක ද, දෘශ්‍ය හා කථන ආබාධ ඇති තැනැත්තන් සඳහා 88% ක් ද චලන ආබාධ ඇති තැනැත්තන් සඳහා 89% ක් සහ කථන ආබාධ ඇති තැනැත්තන් හා අපස්මාරයෙන් පෙළෙන පුද්ගලයන් සඳහා 90% ක් දක්වා වූ පරාසයක විය.

1 වන වගුවෙන්, මෙම සංඛ්‍යා සහ රැකියා කරන්නවුන් අතුරෙන් දිනකට ඇ ඩො 2.00 කට අඩු ආදායමක් ලබන්නවුන්ගේ සංඛ්‍යාවන් ද ඉදිරිපත් කෙරේ.

(නවතම සංඛ්‍යා ලබා ගත හැකි වර්ෂය වූ) 1995 දී දිනකට ඇමරිකානු ඩොලර් 1.00 ක ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවෙන් පහළ ආදායමක් ලබමින් ජීවත් වන පුද්ගලයන්ගේ ජාතික සංඛ්‍යාව 6.6 ක ප්‍රතිශතයක් විය.[4] ඇමරිකානු ඩොලර් 2.00 ක ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවෙන් පහළ ආදායමක් ලබමින් ජීවත් වන පුද්ගලයන්ගේ සංඛ්‍යාව 45.3% ක් විය. මේ

---

3 Ministry of Social Welfare: *Report of a Social Research Study on Disability*. Draft March 2003

4 ILO Geneva: *Key Indicators of the Labour Market, 2001-2002*

රටේ දුගී ජනතාව අතුරෙන් දුගීතම ජනයා වන්නේ ආබාධ ඇති තැනැත්තන් බව මෙයින් පෙනී යයි.

මෙම පහළ ආදායම් දෘෂ්ටි කෝණයෙන් බලන කල, ආබාධ ඇති පුද්ගලයෝ සිය ජීවිත කාලය පුරා අන්‍යයන්ගෙන් යැපෙන්නන් වශයෙන් දිවි ගෙවති. තම පවුලේ එක් සාමාජිකයෙකුගේ ආබාධ ඇති බව නිසා තමනට අමතර වියදමක් දැරීමට සිදු වූ බව පවුල්වලින් 53% ක් ප්‍රකාශ කළහ. සමාන හේතුව නිසා වැඩි ආදායමක් ලැබීමේ හැකියාව පවුල්වලින් 51% කට අහිමි විය.

එසේ ම සුභසාධන ප්‍රතිලාභ ලබා ගන්නේ 41% ක් පමණි. මෙයින් 62% ක් සමෘද්ධි ප්‍රතිලාභීන් වූ අතර 43% ක් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් මසකට රු 100 - 300 දක්වා සමාජ සුභසාධන ප්‍රතිලාභ ලැබූහ.

වගුව I: ආබාධ ඇති සහ රැකියාවක් ඇති (අවුරුදු 18 ට වැඩි) වැඩිහිටියන්ගේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳ සමහර අංශ ආබාධ වර්ගය අනුව,
(මූලාශ්‍රය සමාජ සුභසාධන අමාත්‍යාංශය, ආබාධිත බව පිළිබඳ සමාජ පර්යේෂණ අධ්‍යයනය, 2003 මාර්තු කෙටුම්පත)

| | ආබාධය | පෞද්ගලික ආදායම | | පවුලේ ආදායම | | රැකියාව | නිපුණතා සංවර්ධනය |
|---|---|---|---|---|---|---|---|
| | | දිනකට ඇ. ඩො 1.00 ට අඩු | දිනකට ඇ. ඩො 2.00 ට අඩු | දිනකට ඇ. ඩො 1.00 ට අඩු | දිනකට ඇ. ඩො 2.00 ට අඩු | | |
| 1 | දෘශ්‍ය | 43% | 96% | 48% | 88% | 14% | 15% |
| 2 | කථන | 88% | 97% | 54% | 88% | 11% | 15% |
| 3 | ශ්‍රවණ | 81% | 98% | 50% | 90% | 21% | 20% |
| 4 | චලන | 45% | 87% | 50% | 89% | 26% | 16% |
| 5 | බුද්ධිමය | - | - | 59% | 84% | 1% | 5% |
| 6 | මානසික | 72% | 90% | 47% | 85% | 7% | 11% |
| 7 | අපස්මාර | - | - | 49% | 90% | 5% | 16% |

## 2. රැකියාව

1 වන වගුවෙන් දැක්වෙන පරිදි, පහළ මට්ටමේ ආදායම හා සේවා නියුක්තිය අතර සම්බන්ධය අධ්‍යයනයෙන් හෙළි වෙයි. අධ්‍යයනයට සම්බන්ධ බුද්ධිමය ආබාධ සහිත වැඩිහිටියන්ගෙන් රැකියාවල නියුක්තව සිටියේ 1% ක් පමණි. මෙම සංඛ්‍යාව ද ආන්තික හෝ සුළු බුද්ධිමය ආබාධ ඇති වූවන්ගෙන් යුක්ත වීමට ඇති ඉඩකඩ බහුලය. සේවා නියුක්ති අනුපාතය, මානසික ආබාධ ඇති තැනැත්තන් සඳහා 7% ක සුළු ප්‍රතිශතයක සිට චලන ආබාධ ඇති තැනැත්තන් සඳහා 26% ක ඉහළ ප්‍රතිශතයක් දක්වා වූ පරාසයක විය. මෙය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස 10% ක් වශයෙන් තක්සේරු කර ඇති ජාතික සේවා වියුක්ති අනුපාතය සමඟ සසඳා බැලිය යුතුය.

## ලබාගත හැකි ඉඩප්‍රස්ථා

පෞද්ගලික අංශයේ රැකියා ලබා ගත හැක්කේ සේවා නියුක්තව සිටින අයගෙන් 13% ක පමණි. ( II වගුව) මෙය බොහෝ දුරට සේවා යෝජකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ආකල්පමය බාධක නිසා සිදු වන්නකි. මෙය අවබෝධ කර ගත් ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් ආබාධ ඇති තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා උදා කිරීම සඳහා 'ආබාධිතබව පිළිබඳ සේවා යෝජකයන්ගේ ජාලයක්' පිහිටුවා ඇත. සේවා යෝජකයන් විසින් රැකියා සඳහා ආබාධ ඇති තැනැත්තන් තෝරා ගනු ලැබීමේ අවස්ථා වැඩි කිරීමට හේතු වන පරිදි ආබාධ ඇති තැනැත්තන්ට ලංකා හාම්පුතුන්ගේ සම්මේලනයේ දත්ත බැංකුවේ ලියාපදිංචි විය හැකිය.

**වගුව II**: ආබාධ ඇති වැඩිහිටියන්ගේ රැකියා වර්ගය

*(මූලාශ්‍රය: සමාජ සුභසාධන අමාත්‍යංශය. ආබාධිතබව පිළිබඳ සමාජ සමීක්ෂණය, 2003මාර්තු කෙටුම්පත)*

| රැකියා වර්ගය | ස්ත්‍රී පුරුෂ භාවය | | එකතුව % වශයෙන් |
|---|---|---|---|
| | පිරිමින්ගේ % | කාන්තාවන්ගේ % | |
| ස්වයං රැකියා | 36 | 19 | 32 |
| රජයේ රැකියා | 34 | 13 | 29 |
| පුද්ගලික අංශය | 9 | 25 | 13 |
| අනියම් කම්කරු | 11 | 25 | 12 |
| පවුලේ ආදායම උපයන ක්‍රියාකාරකමක් | 9 | 12 | 11 |
| ප්‍රජා සාමාජිකයකුට වැඩ කිරීම | 1 | 6 | 2 |
| එකතුව | 100% | 100% | 100% |

ග්‍රාමීය ප්‍රදේශවල පුද්ගලයන් නාගරික ප්‍රධාන ධාරාවේ සේවා නියුක්තියෙහි යෙදවීම සාර්ථක ක්‍රියාවක් නොවීය. අඩු වැටුප්වලට සාපේක්ෂව නාගරික ජීවිතයේ ඉහළ පිරිවැය, නවාතැන් පහසුකම් සලසා ගැනීමේ දුෂ්කරතාව සහ නාගරික ජීවන රටාවට හැඩගැසීමේ ප්‍රශ්නය යනාදිය ද මේ ගැටලුවට දායක වෙයි.

අබාධ ඇති තැනැත්තන්ගෙන් 32% ක් තරම් සංඛ්‍යාවකට ඉතා බහුල වශයෙන් ලබා ගත හැකි රැකියාව ස්වයං රැකියාව වන අතර 29% ක් රජයේ රැකියාවල නිරත වෙති. ස්වයං රැකියා සම්බන්ධයෙන් වුව ද වැඩි දෙනෙකු වෘත්තීය පුහුණුවක් ලබා නොමැත. ආදායමක් ලබා ගැනීම සඳහා ඔවුන් තම සහජ හැකියාවන් හා නිපුණතාවන් යොදා ගැනීම හෝ පවුලේ සාමාජිකයන්ගෙන් හෝ අසල්වැසියන්ගෙන් ඉගෙන ගත් නිපුණතාවන් භාවිත කිරීම කරන බව ප්‍රජා මූලික වැඩසටහන්වලදී කරන ලද නිරීක්ෂණවලින් හෙළි විය. ස්වභාවික ව්‍යවසායකත්ව නිපුණතා ඇති පුද්ගලයන්ට ස්වයං රැකියාව සාර්ථක එකක් වුව ද, අන්‍යයන්ට එසේ නොවේ. ඔවුන් මුහුණ දෙන විශාලතම සංරෝධය වන්නේ, කළමණාකරණ නිපුණතාවන් ඔවුනට නොතිබීම සහ, ඉදිරියට සැලසුම් කිරීමට නොහැකියාව සහ තම ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ඉතිරි කිරීම් ප්‍රවේසම්සහගත ලෙස පාවිච්චි කිරීමේ නොහැකියාවයි. ඔවුන්ගේ අසාමාර්ථයට හේතු වන තවත් කාරණා වන්නේ වෙළඳපල ඉල්ලුම පිළිබඳ දැනීමක් නොමැති වීම නිසා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දුර්වලකම, අමුද්‍රව්‍ය ලබාගත නොහැකිවීම හා ඒවායේ ඉහල මිළ, ණය මුදල් ලබා ගැනීම සඳහා අඩු පහසුකම් හා පිරිහී යන ආර්ථික වාතාවරණයක් තුළ අලෙවිකරණයේ

දුෂ්කරතා යනාදියයි[5] අපේක්ෂිත ආර්ථික පිබිදීමත් සමඟ, රජය සහ පෞද්ගලික අංශය අතර රැකියා ක්ෂේත්‍රයේ උපාය මාර්ගික හවුල් සම්බන්ධතාව මෙම කණ්ඩායම තුළ දුගී භාවය තුරන් කිරීම සඳහා උපකාරී වනු ඇත.

**ජාතික රැකියා ප්‍රතිපත්තිය**

රැකිරක්ෂා හා කම්කරු අමාත්‍යවරයා විසින් 2002 මැයි මස 01 වන දින නිකුත් කරන ලද රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යංශයේ[6] ජාතික රැකියා ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පත වූකලී, සමහරවිට ආබාධ ඇති තැනැත්තන් ඇතුළත්කොට ඔවුන් සමාජ-ආර්ථික ප්‍රධාන ධාරාවට ඇද ගැනීම සඳහා හඳුන්වා දෙන ලද ප්‍රථම අංශ පිළිබඳ ප්‍රතිපත්තිය විය හැකිය. "සුදුසු රැකියාවක් ලබා ගැනීම, තබා ගැනීම සහ දියුණු කර ගැනීම පිණිස ආබාධ ඇති තැනැත්තන්ට පහසුකම් සැලසීම සඳහා ඔවුන්ගේ දැනුම සහ නිපුණතා ඉහළ නැංවීම පිණිස ආබාධ ඇති තැනැත්තන්ට රජය විසින් අවස්ථා සැපයීම මගින් ප්‍රජාව හෝ සමාජයට සම්බන්ධ වීමට සහ ආර්ථික සහ සමාජ ජීවිතයට ඇතුල්වීමට රජය විසින් හැකියාව ලබා දෙනු ඇති" බව ප්‍රතිපත්ති කෙටුම්පතෙහි විශේෂයෙන් සඳහන් වේ.[7]

රැකියා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පළමු පියවරක් වශයෙන් රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යංශය විසින් මෙම වසරේ ජනවාරි මාසයේ දී රැකියා මූලාශ්‍ර සැපයීමේ සහ භාරදීමේ පද්ධතිය (National Employment Sourcing and Delivery System) දියත් කරන ලදී. මෙය වූකලී දිවයින පුරා ව්‍යාප්තව පවතින සේවා මධ්‍යස්ථාන (රැකියාජාල) 17 කින් යුත් ජාලයක අනුබලය ලත් සම්පූර්ණයෙන් පරිගණක ගත කරන ලද ජාතික රැකියා කරා යොමු කිරීමේ ක්‍රමයකි.[8] වෙනත් රැකියා සොයන්නන් සමග ආබාධ සහිත තැනැත්තන්ට ද රැකියාජාල මධ්‍යස්ථානයක ලියාපදිංචි විය හැකිය.[9] මෙම ලියාපදිංචියේ දී අවශ්‍ය වන්නේ නම් නිපුණතා ඇගැයීමේ හා සංවර්ධනය සඳහා මගපෙන්වීමේ සහ ඉන්පසු ස්වයං රැකියා විවෘත කර දීමේ ක්‍රියාවලියක් සිදු වේ. ස්වයං රැකියා තෝරා ගන්නන්ට මූල්‍ය සහ තාක්ෂණික පහසුකම් ලබා ගැනීම සහ ස්වයං රැකියා ව්‍යාපෘති වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා ගැනීම තෝරා ගත හැකිය. ජාතික රැකියාජාල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ අමාත්‍යංශය සහ ලංකා වානිජ මණ්ඩලය සහභාගිත්වයෙනි. ලංකා වානිජ මණ්ඩලය එය කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි.

## 3 වෘත්තීය නිපුණතා

නිපුණතා සංවර්ධනය සඳහා ඉඩප්‍රස්ථා තිබීම රැකියා කෙරෙහි බලපෑමක් ඇති කළ ආකාරය 1 වන වගුවෙන් දැක්වේ. බුද්ධිමය ආබාධ ඇති තැනැත්තන් අඩුවෙන් ම එනම් 5% කට පමණක් නිපුණතා සංවර්ධනය සඳහා ප්‍රවේශ පහසුකම තිබූ බව පෙනේ. තව ද වෘත්තිය පුහුණුවක් ලබා සිටියේ මානසික ආබාධ ඇති වැඩිහිටියන්ගෙන් 11% ක්, දෘශ්‍ය

---

5 P.Mendis, *Situation of People who have Disabilities in Sri Lanka,* International Comparative Study on Disability Policies and Programs in the 21st Century in Asia and the Pacific, Social Work Research Institute, (Tokyo, November 2001)

6 Ministry of Employment and Labour: Draft National Employment Policy for Sri Lanka. May 2002. www.slnep.org

7 Ibid.

8 The Sunday Times: January 12 2003. *Advertisement "JobsNet"*

9 Information obtained from the Commissioner, Research, Ministry of Employment and Labour, Jan. 2003

ආබාධ ඇති අය සහ කථන ආබාධ ඇති තැනැත්තන්ගෙන් 15% ක්, චලන ආබාධ ඇති තැනැත්තන්ගෙන් සහ අපස්මාරය වැළඳුණු පුද්ගලයන්ගෙන් 16% ක් සහ ශ්‍රවණ ආබාධ ඇති තැනැත්තන්ගෙන් 20% ක් පමණකි.

### *විශේෂ මධ්‍යස්ථානවල දැනට ලබා ගත හැකි අවස්ථා*

ආබාධ ඇති තැනැත්තන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සම්බන්ධයෙන් වගකීම දරන රාජ්‍ය ආයතනය වන්නේ සමාජ සේවා දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුව විසින් සෘජු ව ම පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන 6 ක වෙන් කර තබන තත්ත්වයන් යටතේ සේවාවන් සපයනු ලැබේ. රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වාගෙන යනු ලබන තවත් මධ්‍යස්ථාන 11 ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. මේ සියල්ලෙහිම ඕනෑම අවස්ථාවක දී 925 දෙනෙකුට ඉඩකඩ සැපයීමේ හැකියාවක් ඇත. දෙපාර්තමේන්තුව විසින්, එක් පුහුණුවන්නෙකු සඳහා දිනකට රු 40 ක දීමනාවක් රාජ්‍ය නොවන සංවිධානවලට ගෙවනු ලැබේ. වෘත්තීය පුහුණුව සඳහා තිබෙන ස්ථාන සංඛ්‍යාව 70% කින් වැඩි කිරීමට මෙම රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වය හේතු වී ඇත.

රැකියා සොයන්නන්ගේ ලේඛනයක් පවත්වාගෙන යමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් රැකියා අයදුම්කරුවන් සහ අනාගත සේවා යෝජකයන් අතර සබඳතාව ඇති කරයි. ඇගලුම් මැසීම සහ වායුසමනය කිරීම/ශීතකරණ අංශයන්හි පාඨමාලා නිමකරන්නන්ට රැකියා ඉඩප්‍රස්ථා සැලසීම මගින් බොහෝ දුරට සාර්ථකත්වය ළඟා කර ගනු ලැබේ. වඩුවැඩ, රෙදි වියීම, කෘෂිකර්මය, වේවැල් වැඩ සහ කොහු වැඩ වැනි නිපුණතා සඳහා වැටුප් ගෙවන රැකියා සොයා ගැනීම දුෂ්කර වේ. එවැනි පුද්ගලයන්ට ලබා ගත හැකි ඇති එකම තේරීම වන්නේ ස්වයං රැකියාවයි. ස්වයං රැකියා සඳහා යොමු වන එවැනි සෑම පුද්ගලයෙකුට ම රු 10,000/- ක උපරිම වටිනාකමකින් යුත් ආයුධ කට්ටලයක් දෙනු ලැබේ. එක් එක් පුද්ගලයාගේ නිවසට ආසන්නයෙන්ම සිටින සමාජ සේවා නිලධාරියාට දැනුම් දෙනු ලබන අතර ඔහු විසින් පසු සහය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරිපත් කරනු ලබන පාඨමාලා බොහෝවිට වෙළඳපල අරමුණු කරගත් ඒවා නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දෙනු ලබන පුහුණුව සහ රැකියා අවස්ථා අතර නිපුණතාවන්හි නොගැළපීමක් ඇති වේ. නිපුණතා පුහුණුව වෙනස් කිරීම සම්බන්ධයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව මුහුණ දෙන දුෂ්කරතා ලෙස දක්වා ඇති කරුණ වන්නේ යල්පැනගිය පාඨමාලාවල උපදේශකයන්ට සිය රැකියා අහිමිවීම, නූතන තාක්ෂණ දැණුම සහිත නව උපදේශකයන් රාජ්‍ය අංශයට ඇද ගැනීමේ දුෂ්කකරතාව සහ පුහුණුවන්නන්ට අවශ්‍ය වන උපකරණ මිල දී ගැනීම ඇතුළුව නව පාඨමාලා සකස් කිරීම හා පිහිටුවීම සඳහා වැය වන පිරිවැය යනාදියයි.[10]

### *ප්‍රධාන ධාරාවේ ක්‍රමයන්හි වෘත්තීය පුහුණුව*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද, "තෘතීයික සහ වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ නාමාවලියෙහි"[11] දිවයින පුරා වෘත්තීය පුහුණු ආයතන 920 ක් ලැයිස්තුගත කර ඇත. මේවාට රාජ්‍ය අංශයේ 556 ක්, පෞද්ගලික අංශයේ 252 ක් සහ රාජ්‍ය නොවන සංවිධාන අංශයේ 112 ක් අයත් වේ. වෘත්තීය පුහුණුව

---

10 Information obtained from the Department of Social Services, May 2002

11 Tertiary Education and Vocational Training Commission: *Directory of Tertiary Education and* Vocational Training (TEVT) Institutions, 2001

සපයන විශාලතම ආයතනය වන්නේ, දිවයින පුරා ව්‍යාප්තව ඇති හා ග්‍රාමීය ප්‍රදේශවල බොහොමයක් පිහිටා ඇති මධ්‍යස්ථාන 145 ක ජාලයකින් යුත් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියයි. ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියට සෑම අවස්ථාවක දී ම පුහුණුවන්නන් ආසන්න වශයෙන් 20,000 ක් පමණ ඇත.

ආබාධ ඇති බොහෝ පුද්ගලයන් මෙම පුහුණු ආයතනවල වෘත්තීය පුහුණුව ලබාගෙන ඇති බව දැන ගන්නට ඇති නමුත් මේ පිළිබඳ වැඩිදුර විස්තර හෝ සංඛ්‍යාලේඛන ලබාගත නොහැකිය. සමාජ සංවර්ධනය සහ අයිතිවාසිකම් අනුව, ආබාධ ඇති තැනැත්තන්ට මෙම සියලු ප්‍රධාන ධාරාවේ වෘත්තීය පුහුණු ආයතනවලට සමාන ප්‍රවේශ පහසුකම් තිබිය යුතුය. ආබාධ ඇති තැනැත්තන්ට නිපුණතා සංවර්ධනය සැපයීම සඳහා යොදා ගත හැකි විශාල සම්පතක් ලෙස මෙම ආයතන පවතී.

*වෘත්තීය මාර්ගෝපදේශනය*

ආබාධ ඇති තැනැත්තන්ට වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා ප්‍රවේශ පහසුකම් ලැබී නොමැත. නිපුණතා සංවර්ධනය සහ රැකියා සඳහා නියමාකාර ලෙස තෝරා ගැනීමක් නොකිරීම නිසා නිෂේධාත්මක ප්‍රතිඵල උද්ගත වී ඇත. තෘතීයික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අමාත්‍යාංශය සහ ජාතික තරුණ සේවා සභාව යටතේ වෘත්තීය පුහුණු ආයතනවල සහයෝගිතා ක්‍රියාකාරකමක් ලෙස, වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවල දිවයිනව්‍යාප්ත ජාලයක් ස්ථාපිත කරගෙන යනු ලැබේ. වෘත්තීය මාර්ගෝපදේශනය අවශ්‍ය වන ආබාධ ඇති තරුණ පුද්ගලයන්ට සහ වැඩිහිටියන්ට එවැනි මධ්‍යස්ථානවලට සමාන ප්‍රවේශ පහසුකම් තිබිය යුතුය.

## 4 අධ්‍යාපනය

### (1) ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය

ප්‍රථම බිහිරි හා අන්ධ පාසල ආරම්භ කළ 1912 වර්ෂය වැනි ඈත කාලයක පටන් ආබාධ ඇති දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කිරීමේ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ පවතී. 1970 දශකයේ මුල් කාලයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමෝධානය මගින් මෙම දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා වැඩිකරලීම ආරම්භ කරන ලදී.[12] වඩාත් මෑතක දී ජාත්‍යන්තර වර්ධනයන්ට අනුකූලව සහ විශේෂයෙන් ම ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත කර ගැනීමත් සමග අන්තර්කරණ අධ්‍යාපනය කෙරෙහි අවධාරණයක් දැකිය හැකිය.[13] දැනට ආබාධ ඇති ළමෝ රජයේ පාසල්වල සාමාන්‍ය පන්තිවලට ඇතුළත් ව හෝ සාමාන්‍ය පාසල්වලට අනුබද්ධිත විශේෂ අධ්‍යාපන ඒකකවල අධ්‍යාපනය ලබති. සිය කැමැත්තෙන් සම්බන්ධ වන අය හෝ මෙම ධාරාවන් දෙකින් එකකට නොගැළපෙන අය රාජ්‍ය නොවන සංවිධාන විසින් සහ පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ පාසල්වල අධ්‍යාපනය ලබති. පශ්චාත් සංශෝධන

---

12 Integrated Education: *placement of children who have disability in ordinary school settings with perhaps special adaptations to meet the needs of particular disability groups, for example the Braille system for those with loss of sight*

13 Inclusive Education: *the education system itself, and each school and classroom recognizes and responds to the diversity of each child's particular needs and abilities within one school system by using child-centred teaching methods etc. A child who has disability is not viewed as a "disabled child" but as a child who has certain particular needs as do many children in the same classroom.*

සමග " (1948) ඉංග්‍රීසි ආධාර ලබන පාසල් සඳහා රීති සංග්‍රහයක්" මගින් මෙම රාජ්‍ය නොවන විශේෂ පාසල් පවත්වාගෙන යාම පාලනය කෙරේ.

අනිවාර්ය අධ්‍යාපන ආඥාපණත[14] වයස අවුරුදු 5 සිට 14 දක්වා වයස්වල සියලු දරුවන්ට සමාන ලෙස අදාල වේ. කෙසේ වුව ද ආබාධ ඇති තැනැත්තන් සම්බන්ධයෙන් වැඩ කරන සේවකයන්ගේ අත්දැකීම වන්නේ, පාසල් අධ්‍යාපනය ආරම්භ නොකරන ආබාධ ඇති ළමුන් ප්‍රමාණයක් තවමත් සිටින බවයි. වඩාත් බරපතල මට්ටමේ හා බහුවිධ ආබාධවලින් යුත් ළමුන් සහ බුද්ධිමය ආබාධ ඇති ළමුන්ට අධ්‍යාපනය සඳහා කිසිදු අවස්ථාවක් නොලැබේ. රජයේ හා පෞද්ගලික අධ්‍යාපන ක්‍රමයට මෙම ළමුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂ දැනුම සහ හැකියාව නොමැත.

වගුව **III:** පාසල් අධ්‍යාපනය ලබා ඇති ආබාධ ඇති වැඩිහිටියන් සහ උසස් සහ නොවිධිමත් අධ්‍යාපනයක් ලබා ඇති ආබාධ ඇති වැඩිහිටියන්ගේ අධ්‍යාපන මට්ටම ආබාධය අනුව *(මූලාශ්‍රය: සමාජ සුභසාධන අමාත්‍යංශය. ආබාධිතබව පිළිබඳ සමාජ සමීක්ෂණය 2003මාර්තු කෙටුම්පත)*

| | ආබාධය | පාසල් යාම ඇරඹි වැඩිහිටියන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය | | පාසල් යාම ඇරඹි අයගේ අධ්‍යාපන මට්ටම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5 වන ශ්‍රේණියට පහළ | 5 වන ශ්‍රේණිය | 6-9 ශ්‍රේණි | අ.පො.ස (සා.පෙ) | අ.පො.ස (උ.පෙ) | විධිමත් අධ්‍යාපනයක් නොමැති | උසස් අධ්‍යාපනය | නොවිධිමත් අධ්‍යාපනය |
| 1 | දෘශ්‍ය | 70 | 70 | 26% | 11% | 34% | 23% | 4% | 1% | 1% | 0 |
| 2 | කථන | 66 | 46% | 33% | 9% | 28% | 10% | 3% | 12% | 3% | 1% |
| 3 | ශ්‍රවණ | 52 | 51% | 32% | 8% | 28% | 18% | 0 | 11% | 0 | 0 |
| 4 | චලන | 159 | 76% | 18% | 6% | 34% | 30% | 10% | 1%1 | 0 | 5% |
| 5 | බුද්ධිමය | 43 | 33% | 46% | 3% | 18% | 14% | 0 | 18% | 0 | 3% |
| 6 | මානසික | 81 | 88% | 21% | 12% | 20% | 32% | 10% | 3% | 2% | na* |
| 7 | අපස්මාර | 24 | 68% | na | na | na | na | na | 7% | na | na |

** පාසල් අධ්‍යාපනය ලැබූ සංඛ්‍යාව ඉතා සුළු*

ආබාධ ඇති වැඩිහිටියන් පිළිබඳ අධ්‍යයනය ද මේ තත්ත්වය පිළිබඳ වැඩිදුර කරුණු හෙළි කිරීමක් කරයි. ( III වන වගුව) බුද්ධිමය ආබාධ ඇති තැනැත්තන්ගෙන් කිසියම් හෝ ආකාරයක අධ්‍යාපනයක් ලබා තිබුණේ 35% ක් පමණි. අනිකුත් ආබාධ සම්බන්ධයෙන් ද තත්ත්වය එතරම් යහපත් නොවිය. [illegible] ආබාධ ඇති අයගෙන් 53% ක් සහ අපස්මාරය වැළඳී සිටි අයගෙන් 68% ක් පාසල් ගොස් තිබුණි. පුදුමයකට මෙන් චලන ආබාධ ඇති තැනැත්තන්ගෙන් පාසල් ගොස් තිබුණේ 77% ක් පමණි. පාසල්වල ප්‍රවේශ පහසුකම් ඉතා අඩුවෙන් තිබීම මෙයට හේතු විය හැකිය. දශක තුනකට වැඩි කාලයක් තිස්සේ දෘශ්‍ය ආබාධ ඇති ළමුන් සඳහා සමෝධානික අධ්‍යාපනය ලබා දුන්න ද, පාසල් ගොස් තිබුණේ 71% ක් පමණි. මානසික ආබාධ හට ගැනෙන්නේ තරුණ වියේ දී හෝ ඉන්පසුව වන හෙයින්, එම ආබාධ ඇති වැඩිහිටියන්ගෙන් 88% ක් යම් තරමකට හෝ පාසල් ගොස් තිබුණි.

14 Parliament of Sri Lanka: *Compulsory Education Ordinance of Sri Lanka No. 1003/5 of 1997*

විශාල සංඛ්‍යාවක් රජයේ පාසල්වල සහ ප්‍රධාන ධාරාවේ පන්තිවල අධ්‍යාපනය ලබන බව පසුගිය වසර කිහිපයක වාර්ෂික පාසල් සමීක්ෂණවලින් පෙනී යයි. 2001 වර්ෂයේ 4,184,957 ක ශිෂ්‍ය ජනගහණයෙන් 99,024 දෙනෙක් සාමාන්‍ය පන්ති කාමරවල අධ්‍යාපනය ලබන ආබාධ ඇති ළමුන් වූහ. ඔවුන්ගේ ප්‍රතිශතය 2. 37% ක් විය. ( IV වන වගුව) 2000 වර්ෂයේ දී ළමුන් 9257 දෙනෙක් රජයේ පාසල්වල විශේෂ ඒකකවල අධ්‍යාපනය ලබමින් සිටි අතර පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති විශේෂ පාසල් 24 ක අධ්‍යාපනය ලබමින් සිටියේ ළමුන් 2583 දෙනෙක් පමණි.[15]

**වගුව IV:** 2000 – 2001 වර්ෂ සඳහා රජයේ පාසල්වල ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංඛ්‍යා
*(මූලාශ්‍රය: මානව සම්පත් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපන ඒකකය, 2002)*

| | එකතුව | පිරිමි | ගැහැණු | පිරිමි | | ගැහැණු | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **2000 වර්ෂය** | | | | | | | |
| ප්‍රාථමික පාසල් | 50,788 | | | 30,646 | *60.4%* | 20,142 | *39.6 %* |
| ද්විතියික පාසල් | 28,235 | | | 16,423 | *58.2%* | 11,812 | *41.8 %* |
| විද්‍යාල | 1,277 | | | 717 | *56.1%* | 560 | *43.9 %* |
| එකතුව | 80,300 | | | 47,786 | *59.5%* | 32,514 | *40.5 %* |
| 2001 වර්ෂය | | | | | | | |
| | 4,184,957 | 2,087,644 | 2,097,313 | 57,958 | 2.78 | 41,656 | 1.96 |
| 2001 වර්ෂය සමස්ථ | සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව 4,184,957 | | ආබාධ ඇති අයගේ එකතුව 99,024 | | | ප්‍රතිශතය 2.37 | |

*සැලකිල්ලට ලක් විය යුතු ක්ෂේත්‍ර*

- සැලකිල්ලට ලක් විය යුත ප්‍රථම කරුණ වන්නේ කලින් සාකච්ඡා කළ කරුණයි. 92% ක ජාතික ප්‍රාථමික පාසල්වලට ඇතුළත් වීමේ අනුපාතයක් තිබුණ ද, ආබාධ ඇති ළමුන් බොහෝ දෙනෙක් තවමත් පාසල්වලට යාම ආරම්භ නොකරති.

- සැලකිල්ලට ලක් විය යුතු දෙවන කරුණ වන්නේ වාර්ෂික පාසල් සමීක්ෂණ ලේඛනවල පෙන්වා ඇති කරුණයි. ආබාධ ඇති ළමුන් අධ්‍යාපනයෙන් ගිලිහී යන අනුපාතය ඉහළ මට්ටමක පවතී. නිදසුනක් වශයෙන් 2000 වර්ෂයේ දී ප්‍රාථමික පාසල්වල ළමුන් 50,788 දෙනෙක් සිටි බව වාර්තා වන විට ද්විතියික පාසල්වල

15 Ministry of Human Resources, Education and Cultural Affairs, Non-Formal, Continuing and Special Education Unit, 2002



7 – CM 016506

සිටියේ 28,235 ක් (56%) පමණක් වන අතර ඊටත් වඩා පහළ මට්ටමේ සංඛ්‍යාවක්, එනම් 1277 ක් (4. 5%) ක් අපොස (උ. පෙ.) මට්ටමේ අධ්‍යාපනය ලැබූහ.[16]

මෙය සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ආබාධ ඇති වැඩිහිටියන් පිළිබඳ සමාජ සමීක්ෂණ අධ්‍යයනය මගින් ද තහවුරු කරන ලදි. පාසල් අධ්‍යාපනයක් ලබා සිටි අය විසින් අත්කරගෙන තිබූ අධ්‍යාපන මට්ටම සහ ගිලිහී යන මට්ටම V වන වගුවෙන් පෙන්වනු ලබයි.

- පාසල් සමීක්ෂණයේ සංඛ්‍යා ලේඛණවලින් උද්ගත වන තවත් සැලකිල්ලට ලක් විය යුතු කරුණක් වන්නේ, IV වන වගුවෙන් පෙන්වා දී ඇති පරිදි ස්ත්‍රී පුරුෂ විෂමතාවයි.

VI වන වගුවෙහි සංඛ්‍යා ලේඛණවලින් ඉස්මතු වන ලක්ෂණයක් වන්නේ, ආබාධ ඇති පාසල් යන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව පාසල් යන පිරිමි ළමුන්ගේ සංඛ්‍යාවට වඩා බෙහෙවින් අඩු වන බවයි. ද්විතියික පාසල්වලට බඳවා ගැනීමේ දළ අනුපාතිකය (1995 - 1997) පිරිමි ළමුන් 71 ට ගැහැණු ළමුන් 78 කි.[17] එසේ ම දශක දෙකක් තිස්සේ ජ්‍යෙෂ්ඨ ද්විතියික පන්තිවල පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමෝ සිටියහ. එය 9 -10 ශ්‍රේණිවල 51% ක් ද 12 සහ 13 ශ්‍රේණිවල 58% ක් ද විය.[18] මෙය 2000 වසරේ දී ලියාපදිංචි වූ ආබාධ ඇති ළමුන්ගේ සංඛ්‍යාව වූ IV වන වගුවේ දැක්වෙන පිරිමි ළමුන් 59. 5% සහ ගැහැණු ළමුන් 40. 5% සමග සසඳා බලන්න.

2001 දී දිවයින පුරා පාසල්වල ලියාපදිංචි වූ සිසුන්ගෙන් පිරිමි හා ගැහැණු ළමුන්ගේ ජාතික අනුපාතිකය පිළිවෙලින් 49.9% හා 50.1% ක් විය. ඒ හා සසඳා බලන කල ආබාධ ඇතැයි සලකනු ලැබූ පිරිමි ළමුන් 2.78% ක් වූ අතර ගැහැණු ළමුන් 1. 96% ක් වූහ.

ආබාධ ඇති ගැහැණු ළමුන් බොහොමයක් පාසල් නොයවන බව මෙයින් පෙනේ. සියලු ආබාධ ඇති කණ්ඩායම් හා සියලු වයස් කාණ්ඩවලට මෙය අදාළ වේ.

මෙයට බෙහෙවින් බලපාන එක් සාධකයක් වන්නේ, බොහෝ දුරට ආබාධ ඇති ගැහැණු ළමයාගේ ආරක්ෂාවයි. ආබාධිත වීම කැළලක් ලෙස සලකන සමාජයකින් තම ළමුන් සහ තමන් ද ආරක්ෂා වීමට පවුල් උත්සාහ දරති. ආබාධ ඇති ගැහැණු ළමයෙකුගේ අධ්‍යාපනය සඳහා වියදම් කිරීම සම්පත් නාස්ති කිරීමක් ලෙස අතීතයේ දී සලකනු ලැබීය. මෙම තැඹුරුව දැන් වෙනස් වෙමින් පවත්නා බව, ගැහැණු ළමයෙකුට වඩා හොඳ අනාගතයක් උදා කිරීම සඳහා ඇයට අධ්‍යාපනයක් ලබා දීමේ අවශ්‍යතාව බොහෝ පවුල් විසින් දැන් පිළිගැනීමෙන් පෙනී යයි.

***1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල බලපෑම***

ප්‍රාථමික මට්ටමේ සියලුම පාසල්වල දැන් හඳුන්වා දී ඇති 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, ආබාධ ඇති ළමුන් සාමාන්‍ය පන්ති කාමරවලට ඇතුළත් කිරීම සඳහා ප්‍රයෝජනවත් විය.

16 Ibid.

17 S. Jayaweera: *Education in Sri Lanka – Fifty Years Since independence, in 50 Years of Sri Lankan Independence: socioeconomic review* ed. by A.D.V.S.Indraratne (Sri Lankan Institute of Social and Economic Studies, Colombo, 1998

18 Ibid

සම්ප්‍රදායික අර්ධ වාර්ෂික අවසාන හෝ වසරාවසාන විභාග ක්‍රමයට වඩා, හැකියාව පදනම් කරගත් විෂය නිර්දේශ සහ අඛණ්ඩ ඇගැයීම් බොහෝ දෙනෙකුට වඩා හොඳින් ගැළපේ. ළමයා කේන්ද්‍ර කරගත් ඉගැන්වීම සහ කණ්ඩායම් සහ ක්‍රියාකාරකම් පදනම් කරගත් ඒවා බවට පන්ති කාමර ඉගැන්වීම් වෙනස්වීම, ප්‍රායෝගික සහ තාක්ෂණික නිපුණතා වර්ධනය කිරීම, විෂය නිර්දේශ සමගාමී ක්‍රියාකාරකම්, උපදේශනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය, පාසල් පදනම් කර ගත් කළමණාකරණය සහ ගුරු අධ්‍යාපනය සඳහා නව උපාය මාර්ග යනාදී සියල්ල අන්තර්කරණ අධ්‍යාපනයේ දී ආබාධ ඇති ළමුන්ට ප්‍රයෝජනවත් වේ.

ආබාධ ඇති ළමුන්ට ප්‍රයෝජනවත් වන්නා වූ තවත් ලක්ෂණයක් වන්නේ, ප්‍රාථමික පාසලට ඇතුල්වන සෑම ළමයෙක්ම දෙමාපියන්ගේ සහභාගිත්වය ඇතිව වෛද්‍ය නිලධාරියෙකු සහ පන්ති භාර ගුරුවරයා විසින් ඇගැයීමට ලක් කිරීම අවශ්‍ය විමයි. මෙම ඇගැයීම් අඛණ්ඩ පදනමක් මත පවත්වාගෙන යා යුතු අතර, ළමයා ප්‍රාථමික අධ්‍යාපනය නිම කරන තෙක් එකතු කෙරේ. මෙම සම්මත ඇගැයීම් සහ වාර්තා ආකෘති පත්‍රය ආබාධ ඇති ළමුන් හඳුනා ගැනීම සඳහා පැහැදිලිව අධාර වන අතර, එය ශ්‍රී ලංකාවේ අනුගමනය කරනු ලබන පැහැදිලි අන්තර්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාශ විමකි. ඇගැයීම්වලින් ලේබල් කිරීමක් දිරිමත් නොකරනු ලබන අතර, එයට වඩා එක් එක් ළමයාගේ සුවිශේෂී ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් ළමයා කේන්ද්‍ර කර ගත් ඉගැන්වීම් ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයාට අනුබල දෙයි. එවැනි ඉගැන්වීමේ ක්‍රමවේදයක් ආබාධ ඇති එක් එක් ළමයාට ප්‍රයෝජනවත් වේ. කෙසේ වුව ද සියලු පාසල් ගුරුවරුන්ට ඵලදායී, යෝග්‍ය සහ අදාල වන්නා වූ මූලික හා අඛණ්ඩ පුහුණුවක් ලබා දීම අවශ්‍ය කෙරේ.

*ගුරු පුහුණුව*

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් භාර ගැනීමත් සමග අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ගුරු පුහුණුව මෑත කාලයේ දී ඉදිරි පියවර තබා ඇත.

- ප්‍රාථමික අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳව ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ට "පුහුණුකරුවන් පුහුණුකරන්නන්" ලෙස මූලික හා අඛණ්ඩ අධ්‍යාපනය ලබා දීම.
- පරිපාලනය සඳහා "අන්තර්කරණ අධ්‍යාපන" කලාප නිලධාරීන් පුහුණු කිරීම සහ පසු පරීක්ෂාව හා අධීක්ෂණය.
- මෙම සියලු නිලධාරීන් මෙන් ම පාසල් ගුරුවරුන් හා මෙම ගුරු පුහුණුකරුවන් විසින් පුහුණු කරනු ලබන අනෙක් නිලධාරීන් පුහුණු කිරීම සඳහා විෂය නිර්දේශ පිළියෙල කිරීම.
- ජාතික අධ්‍යාපන පීඨවලදී අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳව විශේෂඥයන් හෝ සම්පත් දායක ගුරුවරුන් පුහුණු කිරීම සඳහා විෂය නිර්දේශ පිළියෙල කිරීම.
- මෙම සියලු කණ්ඩායම් සඳහා ඉගැන්වීම්-ඉගෙනුම් ද්‍රව්‍ය පිළියෙල කිරීම.
- 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව ආබාධ ඇති ප්‍රාථමික පාසල් ළමුන්ගේ විශේෂ ගැටලු නිරාකරණය කිරීම පිණිස ඉගැන්වීම්-ඉගෙනුම් ද්‍රව්‍ය පිළියෙල කිරීම.
- විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති) පාඨමාලා.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් කරගෙන යනු ලබන මෙම ක්‍රියාකාරකම්වලට අමතර ව අන්තර්කරණ අධ්‍යාපනය සඳහා සම්පත් දායක ගුරුවරුන් බිහි කිරීම පිණිස මීරිගම පිහිටි හාපිටිගම ජාතික අධ්‍යාපන පීඨයේ දී වසර **3** ක පාඨමාලාවක් ආරම්භ කර ඇත.

වසර **2** ක පාඨමාලාවක් මගින් "විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම" මහරගම ගුරු විද්‍යාලයේ දී සිදු කෙරේ. මෙම ගුරුවරුන් බොහෝවිට රජයේ නොවන පාසල්වල සේවය කරති.

***"විශේෂ අවශ්‍යතා" සහ "අබාධිත බව"***

ආබාධ ඇති ළමුන්ට උදා කර ගත හැකි අධ්‍යාපන අවස්ථා[19] පිළිබඳව 2002 නොවැම්බර් මාසයේ දී කරන ලද සමාලෝචනයක දී සොයා ගත් එක් කරුණක් විශේෂයෙන් සිත් ඇද ගන්නා සුලු විය. දැනට දශකයකට වැඩි කාලයක් තිස්සේ අධ්‍යාපන ක්‍රමය විසින් "විශේෂ අවශ්‍යතා ඇති ළමුන්" යන වදන භාවිත කරමින් ආබාධ ඇති ළමුන් ද මෙම කණ්ඩායමට ඇතුල් කර ඇත. මෙම වදනෙහි වැදගත්ම වාසිය වන්නේ, එමගින් අනවශ්‍ය පරිදි ළමුන්ට ලේබල් ඇලවීම අවම කිරීමයි.

සමාලෝචනයේ දී තමන්ගේ ඇත්දැකීම් අනුව "විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ" ගණයට තමන් විසින් ඇතුලත් කරනු ලබන්නේ කුමන ළමුන්දැයි පන්ති භාර ගුරුවරුන්ගෙන් සහ ඔවුන්ගේ සහායක කාර්ය මණ්ඩලයෙන් විමසනු ලැබිය. ආබාධ ඇති ළමුන් මෙම ගණයට ඇතුලත් කරන ලැබුවේ ඉතාමත් කලාතුරකින් බව සමාලෝචන කණ්ඩායමට පෙනී ගියේය. මානසික, සමාජ සහ ආර්ථික ගැටලු සහිත ළමුන් කෙරෙහි ගුරුවරුන් අවධානය යොමු කරන බව පෙනී ගියේය. රට රැකියා කරන දෙමාපියන්ගේ ළමුන්, දුගී ළමුන්, බේබදු පියවරුන් සිටින ළමුන් හා වෙනත් දුෂ්කර තත්ත්වයන්හි සිටින ළමුන් පිළිබඳව නිතරම සඳහන් විය. මෙම ගමන් මගේ යම් අවස්ථාවක දී ආබාධ ඇති ළමුන් සම්පූර්ණයෙන් ගිලිහී ගොස් ඇති බව සමාලෝචකයන්ට පැහැදිලි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආබාධ ඇති ළමුන්ගේ විශේෂ අවශ්‍යතා ගුරුවරුන් විසින් සැලකිල්ලට නොගන්නා බව පෙනී ගොස් ඇත. තවද ආබාධ ඇති ළමුන් "විශේෂ ඒකකවල" තැබිය යුතු බවත් ඔවුනට සාමාන්‍ය පන්ති කාමරයේ ස්ථානයක් හිමි නොවන බවත් සම්මුඛ සාකච්ඡාවලට භාජනය වූ බොහෝ දෙනෙකුගේ මතය වූ බව පෙනී ගියේය.

එහෙයින් ප්‍රධාන ධාරාවේ පන්ති කාමරයේ සහ අධ්‍යාපන ක්‍රමයේ සන්දර්භය තුළ "ආබාධිත බව" යන වදන භාවිත කිරීම කරා ආපසු යාම අවශ්‍ය වේ. ආබාධ ඇති ළමුන් හඳුනාගෙන ඔවුන්ට ලේබල් ඇලවීමේ අවශ්‍යතාවෙන් තොර ව, තමන්ගේ පන්තිය තුළ දී වෙනත් ළමුන් මෙන් ආබාධ ඇති ළමුන් සමග කටයුතු කිරීමට ගුරුවරුන්ගේ හැකියාව, දැනට සම්පූර්ණකොට ඇති 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ශක්තිමත් කරයි. මෙම ළමුන් ආබාධයක් ඇති ළමුන් වශයෙන් හඳුනා ගැනීම වැදගත් වන්නේ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා ඉටු කළ හැක්කේ එමගින් පමණක් වන හෙයිනි.

***අවසන් නිගමන***

ආබාධ ඇති ළමුන්ට අධ්‍යාපන ඉඩප්‍රස්ථා සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීමක් තිබීම පිළිබඳ ව සැකයක් නොමැත. විශේෂයෙන් ම කලාපයේ වෙනත් රටවල් හා සසඳා බලන

---

19 A.Ahuja & P.Mendis. *Review of Inclusive Education for Children who have Disability.* UNICEF Colombo, 2002

කල, ආබාධ ඇති ළමුන්ට ප්‍රාථමික මට්ටමේ දී අධ්‍යාපන ඉඩප්‍රස්ථා සැලසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින පිළිවෙළ ද සැකයක් නොමැත්තේය. යොදා ගන්නා ලද ප්‍රධාන උපාය මාර්ගය වනතේ මානව සම්පත් සංවර්ධනයේ ප්‍රතිලාභ පන්ති භාර ගුරුවරයාට ද, ඔවුන් මගින් පන්තියේ සියලු ළමුන්ට ද ලැබිය යුතුය යන අවසන් අරමුණ පෙරදැරි කරගෙන සියලුම මට්ටමේ කාර්ය ඵලදායීලෙස මානව සම්පත් සංවර්ධනය සිදු කිරීමයි.

මේ දක්වා අත්කරගෙන තිබෙන දෑ ආබාධිතබව පිළිබඳ ව්‍යාපාරය විසින් අගය කරනු ලබන අතර, කළ යුතු දෑ තවත් බොහොයක් තිබෙන බව එය සිතයි. ප්‍රමාණාත්මක වශයෙන් හෝ සාධාරණ තත්ත්වයක් කරා ළඟා වීමට පෙර අපට තවමත් බොහෝ දුරක් යා යුතුව තිබෙන බව සංඛ්‍යාලේඛන පෙන්වා දෙයි.

ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය පිළිබඳ ගුණාත්මක අධ්‍යයනයන් සිදු කර නොමැති අතර අපේ අත්දැකීම් මත යැපීමට අපට සිදු වී ඇත. අධ්‍යාපනයෙන් ගිලිහෙන ළමුන්ගේ ඉහළ අනුපාතය, පන්ති කාමරයේ දී ආබාධ ඇති ළමුන් ලබන අධ්‍යාපනයේ අප්‍රමාණවත් ගුණාත්මකභාවයේ එක් පිළිබිඹුවක් විය හැකිය. පාසල් අධ්‍යාපනයක් ලබා සිටි අය ළඟා වී ඇති අධ්‍යාපන මට්ටම (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) සහ ගිලිහීමේ මට්ටම V වන වගුවෙන් පෙන්නුම් කරයි. ගුණාත්මක භාවයක් නොමැතිවීම පිළිබඳව ආබාධිතබව පිළිබඳ ව්‍යාපාරය විශේෂයෙන් සැලකිල්ලක් දක්වයි. ඔවුන් සැලකිලිමත් වන්නේ කන් නෑසෙන බැවින් සංඥා භාෂාව භාවිත කරන ළමුන් වැනි ළමුන්ගේ විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අවශ්‍ය වන්නා වූ දැනුම හා නිපුණතා ප්‍රධාන ධාරාවේ පාසල් ගුරුවරුන් විසින් තවමත් අත්කරගෙන නොමැතිවීම සම්බන්ධයෙනි. ආබාධ ඇති වෙනත් බොහෝ ළමුන් මෙන් ඔවුන්ට ද විකල්ප ඉගැන්වීමේ ක්‍රම අවශ්‍ය විය හැකිය. ආබාධ ඇති ළමුන් ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඔබ්බට යන්නේ මේ නිසා නොවේ ද? ප්‍රාථමික පාසල් ප්‍රතිසංස්කරණ මගින් තත්ත්වය දියුණු කිරීමෙහිලා අවශ්‍ය උපාය මාර්ග සපයා ඇති නමුත් ආබාධ ඇති ළමුන් සම්බන්ධයෙන් එහි ප්‍රතිඵල දෙස බලා සිටීමට අපට සිදු වේ. නිදසුනක් වශයෙන් අ. පො. ස. විභාගය වැනි පොදු විභාගවල දී වෛකල්පික විෂයයන් වශයෙන් ඉදිරිපත් කළ හැකි සංඥා භාෂාව සහ බ්‍රේල් ක්‍රමය වැනි ක්ෂේත්‍ර විධිමත් විෂයයන් වශයෙන් ඇතුළත් කිරීම මගින්, වැඩි වැඩියෙන් විවිධත්වය කරා යොමු වීම හා ආබාධ ඇති ළමුන්ගේ විශේෂ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු වීම සිදු විය යුතුය යන්න ආබාධිතබව පිළිබඳ ව්‍යාපාරයේ අදහසයි.

අධ්‍යයන ඉගෙනුමට අතිරේකව, ක්‍රීඩා, නැටුම්, නාට්‍ය සහ වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් වැනි පන්ති කාමරයෙන් බාහිර ඉගෙනුම් තත්ත්වයන්හි දී ආබාධ ඇති ළමුන්ට ඉඩප්‍රස්ථා නොමැති වීම සම්බන්ධයෙන් ද ආබාධිතබව පිළිබඳ ව්‍යාපාරය අවධානය යොමු කරයි. ඇස් නොපෙනන බැවින් සංඥා භාෂාව භාවිත කරන හෝ අන්‍යයන්ට වඩා සෙමින් ඉගෙන ගන්නා ළමුන් බොහෝවිට මෙම ක්‍රියාකාරකම්වලින් ඉවත් කරනු ලැබේ. රෝද පුටු සහ වෙනත් ඇවිදීමේ ආධාරක භාවිත කරන සිසුන් පාසලෙන් ඈත් කිරීමට පාසල්වල ප්‍රවේශ පහසුකම් ඉතා දුර්වලවීම හේතු වන්නාක් මෙන් ම එසේ ලියාපදිංචි වන ළමුන් සඳහා ද ඉඩප්‍රස්ථා සීමා කිරීමට හේතු වෙයි.

එහෙයින් ජාතික ප්‍රතිපත්තිය මගින් දෙවන කොටසේ දී පාසල් අධ්‍යාපනය සම්බන්ධ අංශ පිළිබඳ ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරන අතර, මෙහි සාකච්ඡා කරන කරුණු, අධ්‍යාපන අංශය විසින් ගනු ලබන ප්‍රයත්නයන්ට ආධාර කිරීමට සහ මෙම ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට ඔවුනට උපකාර කිරීමට ගනු ලබන උත්සාහයක් වන්නේය.



8 – CM 016506

### (2) නොවිධිමත් අධ්‍යාපනය

ආබාධ ඇති බොහෝ තැනැත්තන්ට පහළ මට්ටමේ අධ්‍යාපනයක් තිබිය දී සහ ඔවුන්ගෙන් සමහරක් පාසල් යාම අරඹා නොතිබිය දී නොවිධිමත් අධ්‍යාපනය ලබා ඇති සංඛ්‍යාව සීමා සහිත වේ. කථන ආබාධ ඇති අයගෙන් 1% ක් සහ චලන ආබාධ සහ බුද්ධිමය ආබාධ ඇති අයගෙන් 5% ක් පමණක් නොවිධිමත් අධ්‍යාපනය ලබා ඇත. ශ්‍රී ලංකාව පුළුල් නොවිධිමත් අධ්‍යාපනයක් තිබෙන රටක් වශයෙන් ප්‍රකට වන අතර සාධාරණත්ව පදනම මත ආබාධ ඇති තැනැත්තන්ට නොවිධිමත් අධ්‍යාපනය ලබා ගත හැකි විය යුතුය.

### (3) උසස් අධ්‍යාපනය

උසස් අධ්‍යාපනයක් ලබා ඇත්තේ ආබාධ ඇති තැනැත්තන් ඉතා සුළු සංඛ්‍යාවකි. මෙම අධ්‍යයන නියැදියේ දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගෙන් 1% ක් සහ කථන ආබාධ ඇති පුද්ගලයන්ගෙන් 3% ක් පමණක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා තිබුණි.

ප්‍රවේශය සඳහා අනෙකුත් අවශ්‍ය නිර්ණායක සපුරාලන ආබාධ ඇති ශිෂ්‍යයන් විසින්, දැනට විශේෂ අයදුම් පත්‍රයක් සමග වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ. ඔව්හු ප්‍රවේශය ලැබීම සඳහා වෛද්‍ය සම්මුඛ පරීක්ෂණයකට යටත් වෙති. විශ්වවිද්‍යාලවලට ප්‍රවේශය ලබන අයට පඨා පාඨමාලා තෝරා ගැනීමේ වරණය සීමාසහිත වීම නිසා, විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයක් තෝරා ගැනීමේ නිදහස සීමා වී ඇත. ඉඩප්‍රස්ථා පුළුල් කිරීම සඳහා සහ ආබාධ නැති ශිෂ්‍යයන් සමග සමානව තරග කරමින් උසස් පෙළ විභාගය සාර්ථකව නිම කළ ආබාධ ඇති ශිෂ්‍යයන්ට සාධාරණත්වය සැලසීම සඳහා මෙම පරිපාටි සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

## 5 නිවාස

ආබාධ ඇති වැඩිහිටියන්ගෙන් නිවාස හිමිව සිටියේ 14% ක් පමණි. දැනට නිවාස දීමනාවක් හෝ ණය මුදලක් ලබා ගැනීම සඳහා පූර්ව කොන්දේසියක් වන්නේ අදාළ පුද්ගලයාට නිවාසයක් තැනීම සඳහා යෝග්‍ය ඉඩම් කැබැල්ලක් තිබීමයි. මෙම අවශ්‍යතාව සපුරාලන්නේ පුද්ගලයන්ගෙන් 17% ක් පමණක් වීම නිසා, ආබාධ ඇති තැනැත්තන්ට නිවාස ප්‍රදානයක් හෝ ණය මුදලක් ලබා ගත හැකිවීමේ හා තමන් ජීවත් වන නිවස හිමි කර ගැනීමේ අපේක්ෂාව ද හීන වේ. ආබාධ ඇති තැනැත්තන් සඳහා නිවාස හිමිකාරත්ව ඉඩප්‍රස්ථා දියුණු කිරීම පිණිස උපාය මාර්ග සැකසීමේ දී මෙම කරුණු සැලකිල්ලට ගෙන ඇත.

## 6 පොදු සේවා භාවිත කිරීම

### (1) සෞඛ්‍යය

සිය ආබාධිතබව පිළිබඳ උපදෙස් ලබා ගැනීම සඳහා සෞඛ්‍ය සේවාවන් භාවිත කිරීම සාමාන්‍යයෙන් 90% ක පමණ සතුටුදායක මට්ටමක පවතින බව පෙනෙන්නට ඇත. අධ්‍යයන නියැදියේ ශ්‍රවණාබාධ ඇති පුද්ගලයන්ගෙන් 79% ක් පමණක් සෞඛ්‍ය සේවාවන් භාවිත කිරීම සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි.

97% ක් බටහිර වෛද්‍ය සේවාවන් ලබාගෙන තිබූ අතර ආයුර්වේද ප්‍රතිකාර ලබාගෙන තිබුනේ 18% ක් පමණි. කෙසේ වුව ද වෛද්‍ය විෂය නිර්දේශයන්හි ආබාධිතබව මාතෘකාවක් වශයෙන් ඇතුලත්කොට නොමැත. ආබාධිතබව සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෛද්‍ය නිලධාරීන් කොතරම් දුරට මනා ලෙස පුහුණු වී ඇත්දැයි යන ප්‍රශ්නය මින් ඉස්මතු වේ.

**(2) සමාජ සේවා**

අද දින දක්වා ආබාධ ඇති තැනැත්තන් සඳහා සේවාවන් සැලසීමේ ප්‍රධාන වගකීම භාරගෙන ඇත්තේ සමාජ සේවා දෙපාර්තමේන්තුවයි. එවැනි සේවාවන්ට ආධාරක උපකරණ ලබා දීම, පුද්ගලයන්ට ආබාධිතබව පිළිබඳ ප්‍රතිලාභ ගෙවීම, නේවාසික පහසුකම් හා ආබාධිත බව සම්බන්ධ විවිධ සේවා සපයන රාජ්‍ය නොවන සංවිධානවලට ප්‍රදාන ගෙවීම, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 6 ක් පවත්වාගත යාම, ( II 3 බලන්න) ස්වයං රැකියා සඳහා ප්‍රදාන ලබාදීම සහ රැකියා සොයන්නන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම හා ඔවුන්ගේ රැකියා ප්‍රවර්ධනය කිරීම ඇතුලත් වේ. විමධ්‍යගත කිරීමත් සමග පළාත් සභා විසින් ද මෙම කාර්යයන්ගෙන් සමහරක් ඉටු කරනු ලබයි.

මෙම සේවාවන් සැලසීම අයවැය ලේඛන ප්‍රතිපාදන සීමාවන් නිසා සීමා වී ඇත. නිදසුනක් වශයෙන්, පසුගිය වසර 3 තිස්සේ ස්වයං රැකියා සඳහා පළාත් 4 හි දීමනා ගෙවනු ලැබූ පුද්ගලයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 38, 41, 42 සහ 166 ක් විය.[20] අධ්‍යයනයේ පුද්ගලයන්ගෙන් 67% ක් දෙනා දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳව නොදැන සිටීමෙන් මෙම සීමාවේ ප්‍රමාණය තක්සේරු කළ හැකිය. තව ද එම සේවාවන්වලින් ප්‍රයෝජනයක් ලබාගෙන තිබුනේ සේවාවන් පිළිබඳ ව දැන සිටි අයගෙන් 53% ක් පමණි.

සමහර රාජ්‍ය නොවන සංවිධාන විසින්, විශේෂයෙන්ම ආධාරක උපකරණ සහ වෘත්තීය පුහුණුව සැපයීමේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන් පරිපූරණය කර ඇත. "1996 අංක 28 දරණ ආබාධ ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පණත"[21] මගින් පිහිටුවනු ලැබූ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය ද මෙම කාර්යයන් බොහොමයක් ඉටු ලබයි.

## 7 කොන් කරන ලද කණ්ඩායම තුළ කොන් කරන ලද කණ්ඩායම්

**(1) ආබාධ ඇති කාන්තාවන්**

ආබාධ ඇති කාන්තාවෝ පැහැදිලි ලෙස වෙනස්කම්වලට භාජනය වෙති. ආබාධ ඇති තැනැත්තන් අතර සමස්ත සේවා නියුක්ත අනුපාතය 16% ක් වන විට ස්ත්‍රී පුරුෂ භාවය අනුව එය පිරිමින් සඳහා 22% ක් ද කාන්තාවන් සඳහා 8% ක් ද විය.

පිරිමින් හා සසඳා බලන කල පාසල් යාමේ ඉඩප්‍රස්ථා ලැබූ කාන්තාවන් අඩු විය. එය කාන්තාවන් සඳහා 63% ක් වන විට පිරිමින් සඳහා 71% ක් විය. පහත V වන වගුවේ

---

20 Information obtained from 4 Provincial Councils

21 Parliament of Sri Lanka. "Protection of the Rights of Persons with Disabilities Act, No. 28 of 1996

දැක්වෙන පරිදි, පාසල් යාමේ ඉඩ ප්‍රස්ථා ලැබූ කාන්තාවන් පවා සාමාන්‍යයෙන් පහළ මට්ටමේ අධ්‍යාපනයක් ලබා තිබුණි.

**වගුව V:** ආබාධ ඇති පිරිමින් සහ කාන්තාවන් විසින් ලබාගෙන තිබූ සංසන්දනාත්මක අධ්‍යාපන මට්ටම් හා ආදායම් මට්ටම්
*(මූලාශ්‍රය: සමාජ සුභසාධන අමාත්‍යංශය, සමාජ සමීක්ෂණ අධ්‍යයනය 2003 මාර්ත කෙටුම්පත)*

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී පුරුෂ භාවය | | | මාසික පෞද්ගලික ආදායම රුපියල්වලින් | ස්ත්‍රී පුරුෂ භාවය | | |
|---|---|---|---|---|---|---|---|
| | පිරිමි % | ගැහැණු % | එකතුව % | | පිරිමි % | ගැහැණු % | එකතුව % |
| 5 ශ්‍රේණියට පහළ | 24 | 28 | 26 | 1000/- ට අඩු | 7 | 12 | 8 |
| 5 ශ්‍රේණිය | 7 | 11 | 8 | 1001 – 1500 | 11 | 31 | 15 |
| 6-9 ශ්‍රේණි | 31 | 30 | 31 | 1501 – 3000 | 30 | 31 | 30 |
| අපොස සාපෙ | 30 | 21 | 26 | 3001 – 6000 | 41 | 24 | 37 |
| අපොස උපෙ | .7 | 9 | 8 | 6000 ට වැඩි | 11- | 2 | 9 |
| උසස් අධ්‍යාපනය | 1 | 0 | 1 | | | | |
| එකතුව | 100% | 100% | 100% | | 100% | 100% | 100% |

V වන වගුවේ දැක්වෙන පරිදි කාන්තාවන් අතර දුගී භාවය පිරිමින් අතර දුගී භාවයට වඩා වැඩි වේ. කාන්තාවන්ගෙන් 74% කට දිනකට රු. 3000/- කට වඩා අඩු ආදායමක් ද, 98% කට දිනකට රු. 6000 කට වඩා අඩු ආදායමක් ද ලැබෙන විට පිරිමින් සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා පිළිවෙළින් 48% ක් හා 89% ක් විය

කාන්තාවෝ ඉහළ ප්‍රමාණයකින් නිශේධාත්මක ආකල්පවලට මුහුණ දෙති. ආබාධ ඇති සිය පවුලේ කාන්තා සාමාජිකාවන් ප්‍රතික්ෂේප කරනු ලබන හා ගර්හා කරන සමාජයකින් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා පවුල් උත්සාහ ගනිති. සමාජ අයුතු භාවිතයෙන් මෙන්ම ලිංගික අපයෝජනයෙන් ද කාන්තාවන් ආරක්ෂා කරගත යුතු වේ. ආබාධ ඇති කාන්තාවන්ගේ යහ පැවැත්ම පිළිබඳව වගකීමක් දරන්නා වූ පවුල් සහ අධිකාරීහු ඔවුන් පිරිමින්ගේ ලිංගික හැසිරීමෙන් ආරක්ෂා කර ගැනීමට උත්සාහ දරති. මෙම රැකවරණය ලෙහෙසියෙන් ම අති රැකවරණයක් බවට යොමු වන අතර සමහරවිට සමහරුන් සලකන ආකාරයට පරිපීඩනයක් බවට පත් වේ. ආබාධ ඇති කාන්තාවන් පවසන පරිදි, “අපට අධ්‍යාපනය සඳහා ඉඩප්‍රස්ථා නැහැ. රැකියාවක් කිරීමේ අවස්ථාවක් නැහැ. විවාහයක් කර ගැනීමේ අවස්ථාවක් ද නැහැ. ඉතින් අපේ අනාගතය කුමක් ද?”

### (2) ආබාධ ඇති ළමුන්

එක් එක් ළමයාගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතු බවත්, කිසිම ආකාරයේ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකරමින් ඒවා සහතික කළ යුතු බවත් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය පැහැදිලි ව ප්‍රකාශ කරයි. ( 2 වන වගන්තිය) එහෙත් රාජ්‍ය අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වාගෙන යනු

ලබන ප්‍රධාන ධාරාවේ ළමා වැඩසටහන්වල සහ ක්‍රියාකාරකම්වලට තවමත් සාමාන්‍යයෙන් ඇතුළත් කරගනු ලබන්නේ ආබාධ ඇති ළමුන් සුළු සංඛ්‍යාවක් පමණි. නිදසුනක් වශයෙන්, මුල් ළමා වියේ රැකවරණ සහ සංවර්ධන වැඩසටහන්වලට ආබාධ ඇති ළමුන් ඇතුළත් කර ගනු ලබන්නේ කලාතුරකිනි. ප්‍රධාන ධාරාවේ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම්වල පවා අන්තර්කරණය ප්‍රවර්ධනය නොකෙරේ. ළමා ආබාධිත බව පිළිබඳ වැඩසටහන් ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණක් වන අතර, එසේ පවතින වැඩසටහන් පවා ක්‍රියාත්මක කරනු ලබන්නේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මගින් ප්‍රකාශ කළ පරිදි අන්තර්කරණ එළඹුමක් අනුව නොව ප්‍රධාන ධාරාවේ වැඩසටහන්වලට සමගාමීව ය.

එහෙයින් මුල් ළමා අවධියේ දී සෞඛ්‍ය ක්‍රමය මගින්, විශේෂයෙන් ම මාතෘ සහ ළමා සෞඛ්‍ය වැඩසටහන් මගින් ආබාධිතබව හඳුනා ගත හැකි වුව ද, මුල් කාලීන උත්තේජන වැඩසටහන් හෝ පසු විපරම් මැදිහත්වීම් සිදුවන්නේ කලාතුරකිනි. ප්‍රායෝගික ව එය ආබාධිතබවෙහි ප්‍රතිඵල ජයගැනීම සඳහා සහ උපරිම හා සමස්ත සංවර්ධනය සඳහා ළමයාට අවශ්‍ය වන්නා වූ සැලකිල්ල හා උත්තේජනය අහිමි කරනු ලබයි. එය ධනාත්මක ස්වයං ප්‍රතිරූපය සහ නෛසර්ගික හැකියාවන් වර්ධනය වීම මොට කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආබාධිතබවෙහි ප්‍රතිඵල ළමයාගේ වැඩිවීමත් සමග ගුණාකාරව වැඩි වෙයි.

සමහර වර්ගයේ ආබාධිත භාවයන් ඇති ළමුන්ට ඉඩප්‍රස්ථා ලැබුන ද ඒවා විරල බව සටහන් කර ගත යුතුය. ශ්‍රවණ, කථන සහ දෘශ්‍ය සම්පූර්ණයෙන් අහිමිවීමක සංකලනයක් ඇති ("බිහිරි – අන්ධ" "බිහිරි ගොළු සහ අන්ධ") ළමුන්ට ඉඩප්‍රස්ථා නොලැබේ. ස්වෛච්ඡතාව (autism), වචන අන්ධතාව (dyslexia), අවධානය ඌණ සහලක්ෂණය (attention deficit syndrome) ඇති ළමුන් සඳහා විශේෂඥභාවය ඇත්තේ ඉතා අඩු වශයෙනි.

අධ්‍යාපන ක්‍රමය තුළ ආබාධ ඇති ළමුන්ගේ තත්ත්වය කලින් සාකච්ඡා කර ඇත.

**(3) බුද්ධිමය ආබාධ ඇති තැනැත්තන්**

ශ්‍රී ලංකාවේ ආබාධ ඇති කණ්ඩායම් අතුරෙන් ඉතා වැඩිවශයෙන් කොන් කරනු ලැබීමට ලක් වී ඇත්තේ (මානසික මන්දගාමීබව නිසා) බුද්ධිමය ආබාධිතබවින් යුත් පුද්ගලයන් වේ. මෙය මෙම ලේඛනයේ ( වගු I සහ III ) දත්තවලින් සනාථ වී ඇත.

සාපේක්ෂ වශයෙන් මෙම ආබාධිතබවෙහි සුළු ප්‍රකාශවීමක් ඇති පුද්ගලයන්ට පාසලට ප්‍රවේශ වීමේ හැකියාව තිබිය හැකි අතර බරපතල ආබාධිතවීමක් ඇති අයට කිසිදු සේවාවක් නොලැබේ. පාසල් යාම හා අධ්‍යාපනය සඳහා අයිතිය කණ්ඩායමක් වශයෙන් ඔවුනට අහිමි වී ඇත. එයට හේතුව වන්නේ විශේෂ පාසල්වලට හා ගුරුවරුන්ට පවා මෙම ළමුන්ට උපකාර කිරීම සඳහා අවශ්‍ය සම්පත් නොමැති බැවිනි. මෙම හේතුව නිසාම නිපුණතා සංවර්ධනය සඳහා ඔවුන්ගේ අයදුම්පත් රීතියක් වශයෙන් ප්‍රතික්ෂේප වේ. ඉක්මන් මරණයක් අත්වනතෙක් ඔවුහු අයහපත් ජීවන තත්ත්වයක් ගත කරමින් හුදෙකලා වී සහ වෙන් වී සිටිති.

බොහෝ තරුණ ගැහැණු ළමුන් සහ කාන්තාවන් ලිංගික අපයෝජනයට ලක් වෙති. ඔවුනට යුක්තිය කරා ළඟා විය නොහැකිය.

**(4) මානසික ආබාධ ඇති තැනැත්තන්**

මානසික ආබාධ බහුලව ඇති වන්නේ භින්නෝන්මාදය (Schizophrenia) හේතුවෙනි. එය සියලු මානසික රෝගවලින් 80 – 90% ක් වෙයි. එය තරුණ පුද්ගලයන්ට වැළඳෙන අතර රෝගයේ උත්සන්නතම අවස්ථාවේදී නැවත නරක තත්ත්වයට පත්වන අතර ප්‍රතිකාර මගින් සුව කළ හැකිය. රෝගය වැළඳුනු අයගෙන් 20 – 30% කට ස්වාධීන ජීවිතයක් ගත කළ හැකිය. අනෙක් අයගේ හැසිරීමේ බරපතල වෙනස්කම් සහ විවිධ ආකාරයේ ආබාධ ඇති විය හැකිය. පෙළඹවීමක් නොමැතිවීම, සිතීමේ, හැඟීම්වල සහ ප්‍රජානනයේ දුබලතා සහ විපරීත හැසිරීම පවුල තුළ, වැඩපලෙහි සහ සමාජ අන්තර් ක්‍රියාවන්හි අන්තර්පුද්ගල සබඳතාවන්හි ගැටලු ඇති කිරීමට හේතු වෙයි. මෙම තත්ත්වයන්හි සිටින පුද්ගලයන්ට උපකාර කිරීම සඳහා ප්‍රමාණවත් සේවාවන් නොතිබීම, ඔවුන් සහ ඔවුන්ගේ පවුල් හා ප්‍රජාව අතර බැඳීම් ගිලිහී යාමට හා සමාජ ප්‍රශ්න පරාසයක් ඇති කිරීමට හේතු වේ.

මෙම ලේඛනයෙහි සඳහන් සියලු දත්තවල පැහැදිලි වන පරිදි, මෙම ආබාධිත තත්ත්වයෙන් සිටින පුද්ගලයන් ඉතා වැඩි වශයෙන් සමාජයෙන් ගැරහුම් ලබන්නෝ වෙති. “පිස්සන්” වශයෙන් ලේබල් ඇලවීමට ලක් වී ඇති ඔව්හු පවුලෙන් හා සමාජයෙන් කොන් කරනු ලැබ සිටිති. දැනට රාජ්‍ය නොවන සංවිධාන ඉතා සුලු ප්‍රමාණයක් පමණක් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව සොයා බලති. මෙම තත්ත්වයේ සිටින පුද්ගලයන්ට ඉක්මන් සහ ඵලදායී ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාව මෙම ප්‍රතිපත්තිය මගින් අවධාරණය කරනු ලබයි. මෙම ආබාධිතබව ඇති පුද්ගලයන්ට වෙනත් පුරවැසියන්ට මෙන් සාධාරණත්වය සහ සමාජයේ අන්තර්කරණය භුක්ති විඳීමට හැකි වනු පිණිස, මෙම ආබාධිතබව ගර්හාවට ලක් වීමට හේතුවක් නොවීම සඳහා ඵලදායී මැදිහත්වීම් කිරීමේ අවශ්‍යතාව එය පෙන්වා දෙයි.

වැඩි වයස් කණ්ඩායම්වල වැඩිවෙමින් පවත්නා මානසික ආබාධයක් වන්නේ චිත්ත වික්ෂේපයයි. (Dementia). එය අවුරුදු 65 ට වැඩි පුද්ගලයන්ගෙන් 5 - 10% කට වැළඳෙන අතර රෝගය වැල්දීමේ ප්‍රමාණය වයස සමග වැඩි වේ. මතකය අහිමිවීමත් සමග ආරම්භ වන සියලු මානසික කාර්යයන්හි දුර්වලවීම ක්‍රමයෙන් වැඩිවන අතර අවසානයේ දී සම්පූර්ණයෙන් අන්‍යයන් මත රඳා සිටී. වෙනස්වන ජනගහන රටාවන් සමග මේ පිළිබඳව ශ්‍රී ලංකාව දැනුවත් ව සිටිය යුතු අතර අවශ්‍ය සැලකිල්ල සහ උපකාර ලබා දීම මගින් පුද්ගලයන්ගේ සහ පවුල්වල තත්ත්වයේ බලපෑම අවම කිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.

**(5) බරපතල හා බහුවිධ ආබාධ ඇති තැනැත්තන්**

බරපතල හා බහුවිධ ආබාධ ඇති ළමෝ සහ වැඩිහිටියෝ තවත් කොන් වූ කණ්ඩායමකි වෙති. සමහරු ලේ ඥාතීන් අතර සිදු වූ විවාහවල ප්‍රතිඵල විය හැකිය. මෙය ජාන උපදේශනය මගින් අඩු කළ හැකි හේතුවකි.

එසේ ම මෙම කණ්ඩායම තුළ බරපතල මස්තිෂ්ක පක්ෂාඝාතය (cerebral palsy) ඇතිව උපන් ළමුන් සිටිය හැකිය. සෞඛ්‍ය රැකවරණය දියුණු වීමත්, ළදරු මරණ අඩුවීමත් හේතුකොටගෙන එවැනි ළමුන්ගේ වැඩිවීමක් අනාගතයේ සිදුවිය හැකිය. එහෙත් ඔවුනට හා ඔවුන්ගේ පවුල්වලට ලබා දිය හැකි සේවාවන් අපට නොමැත. හුදෙක් ළමයාගේ පමණක් නොව පවුලේ ගුණාත්මක තත්ත්වය පවා අනතුරට පත් වේ. ප්‍රතිපත්තිය මගින් මෙම පුද්ගලයන්, බරපතල බුද්ධිමය ආබාධ ඇති පුද්ගලයන් සමග එකට සලකා බලා, පුද්ගලයාගේ තත්ත්වය සහ පවුලේ තත්ත්වය දියුණු කර ගැනීම සඳහා, පවුලට ඇති හැකියාව ශක්තිමත් කරනු ලබන ප්‍රජා මූලික උපාය මාර්ග යෝජනා කර ඇත.

ආබාධ ඇති පුද්ගලයෝ ශ්‍රී ලංකාවේ ජනගහණයේ දුගීතම කොටසට අයත් වෙති. වැටුප් ලබන රැකියා හා ස්වයං රැකියා සඳහා ඉඩප්‍රස්ථා නොමැතිවීම මගින් ආදායම් ඉපයීම සීමා සහිත වී ඇත. අනෙක් අතට, නිපුණතා සංවර්ධනය (වෘත්තීය පුහුණුව) සඳහා අඩු ප්‍රවේශ පහසුකම් නිසා රැකියා ඉඩප්‍රස්ථා සීමා වී ඇත. බොහෝ දෙනෙකුට දෛනික අවශ්‍යතා සඳහා ජීවිතාවක් සොයා ගැනීමට සිදුවීම් ස්ථිර දෙයක් බවට පත්වී ඇති නිසා නිපුණතා අත්කර ගැනීමේ වැදගත්කමට අවධාණය දිය නොහැක. අනෙක් අයට ප්‍රවේශ නිර්ණායක සපුරාලීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම නිපුණතා පුහුණුව සඳහා බාධකයක් වී ඇත. ආබාධ ඇති තැනැත්තන් කණ්ඩායමක් වශයෙන් දුක්ඛිත දුගීභාවයට ඇද දැමීමට අදාල නිපුණතා නොමැතිවීම හේතු වේ.

ආබාධිතබව සහ දුගීභාවය එකිනෙකට කිට්ටුවෙන් සම්බන්ධවී ඇති ආකාරය මනාව ලේඛනගත වී ඇති අතර 1 වන වගුවෙන් ද ඒ බව සනාථ වී ඇත. මෙයින් බොහෝ ප්‍රතිඵල උද්ගත විය හැකිය. නිශේධාත්මක ආකල්ප, චලනය, ඉපයීමේ හැකියාව පිළිබඳ ගැටලු, ළමුන් බලා ගැනීමේ ප්‍රශ්න ආදිය ඇතුළු අභියෝගතා පරාසයක් හේතුකොටගෙන, ආබාධිතබව සමග පොර බදන පවුල් දුගී භාවයෙහි සිර වී සිටීමට ඇති ඉඩකඩ වැඩි වේ. ආබාධිතබව සමග පොර බදන ළමුන් හා පවුල් ප්‍රධාන ධාරාවෙන් ක්‍රමානුකූලව බැහැර කරනු ලබන අතර ඔවුන් වඩ වඩා දුප්පත් වීමත් සමග බැහැර කිරීමේ ඉඩකඩ ද වැඩි වේ. එහි ප්‍රතිවිරුද්ධ පැත්ත ද සත්‍ය වේ. මෙම තත්ත්වයන් හි දී ආබාධ ඇති දුගී ළමුන්ට ඉක්මන් මැදිහත්වීම්, උපකාර සහ අධ්‍යාපනය ලැබීමට ඇති ඉඩකඩ අඩු වන අතර කල්පවත්නා ප්‍රතිඵලවලින් පීඩා විඳීමට ඇති ඉඩකඩ වැඩි වේ.

ආබාධිතබව සහ දුගී භාවය සංයෝග වීමේ ප්‍රමාණය අනුව සමාජයෙන් බැහැර කිරීමේ ප්‍රමාණය වැඩි වේ. ආබාධ ඇති තැනැත්තන්ගෙන් 83% කට ගුවන් විදුලිය සඳහා ද, 67% කට රූපවාහිනියට සඳහා ද ප්‍රවේශ පහසුකම් ඇති නමුත් පුවත්පත් සඳහා ප්‍රවේශ පහසුකම් ඇත්තේ 32% කට පමණි. සංගීත සංදර්ශන, විවිධ ප්‍රසංග, චිත්‍රපටි සහ වෙනත් ආකාරයේ විනෝදවීම්වලින් ආශ්වාදයක් ලැබීම සඳහා ඉඩප්‍රස්ථා ඇත්තේ 6% පමණ වූ ඉතා සුළු ප්‍රමාණයකට පමණි. 33% ක් පවුලේ අනෙක් අය සමග බැහැර නොයන අතර එම ප්‍රමාණයම විවාහ උත්සවයකට සහභාගිවී නොමැතිවාක් මෙන් ම ප්‍රජා ක්‍රියාකාරකම් සහ උත්සවවලට සහභාගි වී හෝ නොමැත. ආගමික කටයුතුවල සහභාගි වන්නේ 21% ක් පමණි. කුමන හෝ වර්ගයක ක්‍රීඩාවල සහභාගි වී ඇත්තේ 14% ක් පමණක් වන අතර එම සහභාගිත්වය ද සිදු වී ඇත්තේ බොහෝ විට පාසලේ දී හෝ ගම් මට්ටමේ දී ය. ආබාධිතබව වීමේ සමාජ පිරිවැය මැනීම දුෂ්කර කාර්යයක් වන්නේය.

ඔවුන්ගේ දුගී චක්‍රය කඩා දැමීම සඳහා මෙම ගැටලුවේ හරය කෙරෙහි ප්‍රතිපත්තිය අවධානය යොමු කරයි. ආබාධිතබව වැළැක්වීම, ඒවා ඉක්මනින් අනාවරණය කර ගැනීම සහ ඒවාට ප්‍රතිකාරය සඳහා වූ සෞඛ්‍ය රැකවරණයෙන් ආරම්භ කරමින්, හැකි උපරිම සංවර්ධනය පහසු කරලීම පිණිස, මුල් ළමාවියේ රැකවරණය සහ සංවර්ධනයෙහි ඇතුලත් කිරීම කල යුතු බව එය නිර්දේශ කරයි. දුගී භාවයේ චක්‍රයෙන් කැඩී යාම සඳහා අවශ්‍ය ප්‍රායෝගික නිපුණතා හා දැනුම සැපයීමට අධ්‍යාපනයට හැකිය. නිවාස හිමිකම සහිත ප්‍රමාණවත් වාසස්ථාන, සියලු සංවර්ධන අංශවල සහ ක්‍රීඩා වැනි ක්‍රියාකාරකම්වල ඇතුලත් කිරීම ආදිය වෙනම ප්‍රතිපත්ති ක්ෂේත්‍රවල සලකා බලා ඇති හෙයින් ක්‍රියාත්මක කිරීමේ දී ඒවාට නිසි අවධාරණය දැක්විය හැකිය.

# III අන්තර්කරණයට බාධක[22]

## 1. පාරිසරික සහ ප්‍රවාහන ප්‍රවේශ පහසුකම්වලට බාධක

රෝද පුටු භාවිත කරන්නන්ට සහ චලන ආබාධ ඇති හා ගමන් කිරීමේ ආධාරක භාවිතා කරන අනෙක් පුද්ගලයන්ට, පොදු ගොඩනැගිලිවලින් බොහොමයකට ප්‍රවේශවීමේ හැකියාව නොමැත. නාගරික වැඩපලවල්, අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු ආයතන සහ පොදු ගොඩනැගිලි බොහොමයක ඇතුලුවන ස්ථානයේ පියගැට පේලි ඇති අතර තට්ටු රාශියකින් සමන්විත වන අතර සෝපාන නොමැත. රෝද පුටු භාවිත කරන්නන්ට පොදු ප්‍රවාහන සේවා භාවිත කල නොහැකිය. ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ පාරවල් තාර දමා නොමැති අතර අසමමිතික මතුපිටකින් සමන්විත වේ. බස් සේවා දුර්වල වේ. බස් සේවාවන් තිබුන ද බස් රථවල උස, දොර ඉතා පටු වීම ආදිය නිසා බොහෝ දෙනෙකුට බස් සේවා භාවිතා කල නොහැකි වේ. චලන ආබාධවලින් පෙළෙන පුද්ගලයන්ගෙන් බස් රථ භාවිත කරන්නේ 55% ක් පමණක් වන අතර දුම්රිය භාවිත කරන්නේ ඊටත් වඩා අඩු 36% ක ප්‍රමාණයකි. ආබාධ ඇති සියලු කණ්ඩායම් එකට සලකා බැලුව ද සංඛ්‍යා ලේඛන යහපත් නොවේ. 73% ක් පමණක් බස් රථවලින් ගමන් කරන අතර 45% ක් දුම්රිය භාවිත කරති. ආබාධ ඇති තැනැත්තන්ගෙන් බොහොමයක් (83%) ගමන් කිරීම සඳහා අතිරේක වියදමක් දරමින් ත්‍රිරෝද රථ භාවිත කරති. ප්‍රවාහන සේවාවන්ට ප්‍රවේශවීමේ නොහැකියාව, මෙම පුද්ගල කණ්ඩායම්වල රැකියා සහ අධ්‍යාපනික ඉඩප්‍රස්ථා සීමා කිරීමට හේතු වෙයි.

ආබාධ ඇති තැනැත්තන්ට භාවිත කිරීමට අවශ්‍ය, එහෙත් ප්‍රවේශ පහසුකම් නොමැති ස්ථානවලට බැංකු සහ ආගමික ස්ථාන ඇතුලත් වේ. පටු ඇතුලුවීමේ දොරටු සහ සවි කිරීම් ස්ථානගත කර ඇති ආකාරය නිසා පොදු ගොඩනැගිලිවල හෝටල්වල, සිනමා ශාලාවල, රැගුම් ශාලාවල, පාසල්වල වැසිකිලිවලට ප්‍රවේශ විය නොහැකිය.

## 2 සන්නිවේදන බාධක

සන්නිවේදනය සඳහා සංඥා භාෂාව භාවිත කරන්නන්ට ප්‍රධාන ධාරාවේ වෘත්තීය පුහුණුව සහ රැකියා ප්‍රතික්ෂේප වන්නේ, කාර්ය මණ්ඩලවලට මූලික සංඥා කිරීම් පිළිබඳව පවා අවබෝධයක් නොමැති වන හෙයිනි. පෙනීම නොමැති වීම නිසා අසරණ වන්නේය යන සිතිවිල්ලක් සේවා යෝජකයින් විසින් දැරීම නිසා දෘශ්‍ය ආබාධ ඇති අය බැහැර කෙරේ. වෘත්තීය පුහුණු ද්‍රව්‍ය සහ උපදෙස් බ්‍රේල් ක්‍රමයෙන් ලබා ගත නොහැකිය.

සම්පූර්ණයෙන් ශ්‍රවණ අහිමිවීමක් ඇති අයගේ භාෂාව සංඥා භාෂාව වන බවට ප්‍රමාණවත් පිළිගැනීමක් නොමැත. රට තුළ සංඥා භාෂාව ඉගැන්වීමේ හෝ පැහැදිලි කිරීමේ හැකියාවෙන් යුක්ත අය සිටිනුයේ ඉතා සුලු සංඛ්‍යාවකි. විශේෂ පාසල්වල ළමුන්ට සංඥා භාෂාව උගැන්වුව ද, පවුලේ සාමාජිකයන්ට හා අසල්වැසියන්ට ඒ පිළිබඳව දැනුමක් නොමැති වීම නිසා පුද්ගලයෝ තම පවුල සහ ප්‍රජාව තුළ හුදෙකලා වෙති.

---

22 P.Mendis: *ILO Study of Current Training and Employment Policies, Practices and Outcomes in Selected Countries in Asia and the Pacific Region,* ILO Regional Office Bangkok 2002.

සන්නිවේදන දුෂ්කරතා නිසා හුදෙකලා වීමේ ප්‍රමාණය VI වන වගුවෙන් පැහැදිලිව පෙනේ. 7% , 17% සහ 33% කට පිළිවෙලින් සිය පවුල, වෙනත් ප්‍රජාවේ සාමාජිකයන් සහ බාහිර පුද්ගලයන් සමග සන්නිවේදනය කර ගත නොහැකිය. සන්නිවේදනය සඳහා යෝග්‍ය සංඥා භාෂාවක් භාවිත කළ හැක්කේ 17% කට පමණි. වැඩි දෙනෙක් තමන් කියන දෙය පැහැදිලි කිරීම සඳහා තමන් නිර්මාණය කර ගත් සංඥා සහ ඉඟි භාවිත කරන අතර එය දැඩි වෙහෙසක් දරමින් කළ යුතු වේ. ශ්‍රී ලංකාවට තමන්ටම ආවේණික වූ සංඥා භාෂාවක් ඇති අතර අපි සියලු දෙනා එය භාවිත කළ යුතු වෙමු.

**වගුව VI:** කථන සහ ශ්‍රවණ ආබාධ ඇති තැනැත්තන් සන්නිවේදනය කරන ආකාරය
*(මූලාශ්‍රය: සමාජ සුභසාධන අමාත්‍යාංශය සමාජ සමීක්ෂණ අධ්‍යයනය 2003 මාර්තු කෙටුම්පත*

| සන්නිවේදනය කිරීමේ ක්‍රමය | ශ්‍රව්‍ය සහ කථන ආබාධ ඇති අයගෙන් ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|
| | පවුලේ අය සමග | ප්‍රජාවේ සාමාජිකයන් සමග | බාහිර පුද්ගලයන් සමග |
| කොහෙත්ම සන්නිවේදනය කළ නොහැක | 7% | 17% | 33% |
| තමන් නිර්මාණය කළ සංඥා සහ ඉරියව් භාවිත කරමින් | 47% | 37% | 18% |
| යෝග්‍ය සංඥා භාෂාවක් භාවිත කරමින් | 17% | 19% | 17% |
| තොල් සෙලවෙන(කථන)ක්‍රමය භාවිත කරමින් | 27% | 22% | 20% |
| ලිවීම හා කියවීම භාවිත කරමින් | 11% | 12% | 12% |
| වෙනත් | 14% | 12% | 9% |

රූපවාහිනී වැඩසටහන්වල දී සංඥා භාෂාව භාවිත කිරීම ඉතාමත් අඩු වන හෙයින්, ශ්‍රවණ අහිමි වූ පුද්ගලයන්ට ප්‍රවෘත්ති සහ වෙනත් වැදගත් කරුණුවලට ප්‍රවේශය ලැබිය නොහැකිය. විනෝද සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද තත්ත්වය එසේමය.

ශ්‍රවණ අහිමිවීම සහ තමන්ගේම සංඥා භාෂාවක් යොදා ගැනීම මගින් ශ්‍රවණය කළ නොහැකි අයට, තමන්ගේම "බිහිරි සංස්කෘතියක්" සහ හැසිරීම් රටාවක් තිබෙන බව පිළිගැනීමට පවුල් සහ ප්‍රජා සාමාජිකයෝ අසමත් වෙති. ශ්‍රවණය කළ නොහැකි පුද්ගලයන්ට සිය අනන්‍යතාව සහ සාධනීය ස්වයං ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට උපකාර කිරීම සඳහා "බිහිරි සංස්කෘතියක්" පිළිගැනීම අත්‍යවශ්‍ය වේ. ඔවුන්ගේ ස්වයං වර්ධනය සඳහා මෙන් ම මෙරටේ පුරවැසියන් මෙන් දායක වීමට ඔවුනට හැකියාව ලබා දීම සඳහා ද එය අත්‍යවශ්‍ය වේ.

දෘෂ්‍යාබාධිත පුද්ගලයන් පාසලේ දී බ්‍රේල් ක්‍රමය ඉගෙන ගන්නා නමුදු ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් එය පසුව භාවිත කිරීමට අසමත් වෙති. ලිවීම සඳහා බ්‍රේල් උපකරණ නොමැතිවීම සහ බ්‍රේල් ක්‍රමයෙන් සකස් කළ කියවන ද්‍රව්‍ය නොමැති වීම හේතුකොටගෙන, බ්‍රේල් ක්‍රමය දැන සිටි පුද්ගලයන්ගෙන් එය භාවිත කිරීමට හැකියාව තිබුණේ 41% කට පමණි.

චලන ආබාධය නිසා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා දුරකථනය විශේෂයෙන් ප්‍රයෝජනවත් සන්නිවේදන උපකරණයක් වේ. දුරකථන සහ අන්තර්ජාල සේවාවන් භාවිත කිරීම වැළැක්වීමට ඉහළ පිරිවැය හේතු වී ඇත. දුරකථන සඳහා ප්‍රවේශය ඇත්තේ 6% කට පමණි.

මෙම තොරතුරු තාක්ෂණ යුගයේ දී පෞද්ගලික පරිගණක භාවිත කිරීම සඳහා ප්‍රවේශ පහසුකම් ඇත්තේ ආබාධ ඇති තැනැත්තන්ගෙන් 1% කට අඩු ප්‍රමාණයකට පමණි.

## 3 සංස්කෘතික බාධක

ආබාධ ඇති තැනැත්තන් සහ සමහරවිට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් පවා ගර්හාවට ලක් කරනු ලැබීමට බොහෝ අන්ධ විශ්වාස හේතු වී ඇත. නිදසුනක් වශයෙන් යමෙක් ගමනක් යාම ආරම්භ කරනු ලබන අවස්ථාවේ දී ආබාධ ඇති තැනැත්තෙක් දැකීම පවා අශුභ දෙයක් ලෙස බොහෝ දෙනෙක් සලකති. ආබාධ ඇති තැනැත්තන් අවාසනාව උදා කරන බවට වූ අන්ධ විශ්වාසය නිසා, ඔවුන් විවාහ මංගල්‍ය උත්සව සඳහා පිළිනොගැනෙති. ආබාධ ඇති තැනැත්තන්ට විවාහවීමේ අවස්ථා ඉතා අඩු අතර ඔවුන් විසින් ආබාධ සහිත තැනැත්තන් සිය සහකරුවන්/ සහකාරියන් වශයෙන් තෝරා ගත යුතු වේ. ආබාධිත බව අවාසනාවට සම්බන්ධකොට සැලකීම නිසා ආබාධ ඇති තැනැත්තන්ගේ සහෝදර සහෝදරියන්ට, විශේෂයෙන් සහෝදරියන්ට විවාහ සහකරුවෙක් සොයා ගැනීමේ දුෂ්කරතා ඇත.

මේ රටේ අදහනු ලබන සත්‍ය ආගමික දර්ශනයන් සහ විශ්වාස අනුව, ආබාධ ඇති තැනැත්තන් සමාන මිනිසුන් වශයෙන් පිළිගනු ලබන අතර ඔවුන් ප්‍රතික්ෂේප කරනු ලැබීමට හෝ ගර්හාවට ලක් කරනු ලැබීමට ඉඩක් නොමැත්තේය. එසේ වුවද ක්‍රියාකාරීත්වයේ දී අප සමාජය විසින් ආබාධ ඇති තැනැත්තන් ගර්හාවට ලක් කරනු ලැබේ. එසේම අතීතයේ දී පාප ක්‍රියා කළවුන් ලෙස සැලකෙන ආබාධ ඇති තැනැත්තන්ට දන් දීමෙන් තමන්ට පින් රැස් කර ගත හැකි බවට විශ්වාසයක් ද පවතී. දන් දෙන්නා දන් ලබන්නාට වඩා වාසනාවන්ත වන බවට වූ විශ්වාසය අනුව, යහපත් ක්‍රියාවන් කිරීම ආබාධ ඇති තැනැත්තන් පහත් මට්ටමක ලා සැලකීමේ ආකල්පය ශක්තිමත් කිරීමට සහ ඔවුන් සමාජයේ ප්‍රධාන ධාරාවෙන් බැහැර කිරීමට හේතු වේ. එය වූකලී පුද්ගලයන්ගේ ආත්ම ගෞරවය සහ අභිමානයට කරනු ලබන අවමානයකි. සමාන අයිතිවාසිකම් ඇති පුද්ගලයන් සමග බෙදා ගැනීමේ පදනම මත ත්‍යාගශීලීවීම දිරිමත් කළ යුතුය.

## 4 ආධාරක උපකරණ

ආබාධ ඇති තැනැත්තන්ට වඩාත් ස්වාධීන වීමට සහ සමාජයේ ඔවුන් ඇතුළත් කර ගනු ලැබීමට හැකියාව ලබා දෙන විවිධ ආම්පන්න සහ උපකරණ, ආධාරක උපකරණවලට ඇතුළත් වේ. මෙම ආධාරක උපකරණ ලබාගත නොහැකි වීම අන්තර්කරණය සඳහා විශාල බාධාවක් වේ.

චලන ආබාධ ඇති තැනැත්තන් විසින් වැඩි වශයෙන් භාවිත කරනු ලබන ආම්පන්න සහ උපකරණවලට ත්‍රිරෝද බයිසිකල්, රෝද පුටු, කෘත්‍රිම අත් පා සහ කිහිලිකරු හා වෙනත් ඇවිදීමේ ආධාරක ඇතුළත් වේ. ත්‍රිරෝද බයිසිකලයක් හෝ රෝද පුටුවක් තමනට ප්‍රයෝජනවත් වන්නේ යැයි සිතන පුද්ගලයන් අතුරෙන්, එවැනි උපකරණ තිබුනේ 35% කට පමණි. නිවසේ හුදෙකලා වී එයටම සීමා වී සිටීමෙන් ඉවත්ව, සමාජයේ පූර්ණ

සහභාගිත්වයක් ඇති තැනැත්තෙකු බවට පත් කරමින් පුද්ගලයෙකුගේ ජීවන රටාවේ පූර්ණ වෙනසක් ඇති කිරීමේ හැකියාව ත්‍රිරෝද බයිසිකල් සහ රෝද පුටුවලට ඇත. යුද්ධයට සහභාගි වූ පුද්ගලයන් අතර අත් පා අහිමිවූවන් සිටීම, අනාගතයේ දී බිම් බෝම්බවලින් හානියට පත් පුද්ගලයන් වැඩි වීමේ අවදානම සහ දැනටමත් වැඩි වෙමින් පවත්නා දියවැඩියාව වැනි දරුණු රෝග හේතුකොටගෙන අත් පා කපා දැමීමට ලක් වූවන් සිටීමේ හැකියාව නිසා කෘත්‍රිම අත් පා සඳහා ඉල්ලුම එලෙසම පවතී. තව ද අවයව කපා දැමීමට ලක් වූවන්ට ජීවිත කාලය පුරා කෘත්‍රිම අත් පා භාවිත කිරීම අවශ්‍ය වන අතර සාමාන්‍යයෙන් වසර තුනකට හෝ වරක් ඒවා අලුත් කර ගැනීමට සිදු වේ.

ශ්‍රවණ ආබාධ ඇති, එහෙත් යම් ප්‍රමාණයක ශ්‍රවණය කිරීමේ හැකියාවක් ඇති තැනැත්තෝ ශ්‍රවණාධාරවල උපකාරය පතති. තම ශ්‍රවණය කිරීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම සඳහා ශ්‍රවණාධාර උපකාරී වනු ඇතැයි සිතූ පුද්ගලයන්ගෙන් ඒවා ලබා ගැනීමට සමත් වී ඇත්තේ 24% ක් පමණි. ශ්‍රවණ ආබාධ ඇති ළමුන්ට ශ්‍රවණාධාර විශේෂයෙන් ම වැදගත් වන්නේ ඔවුන්ට කථා කිරීමට හැකියාව ලැබීම හෝ නොලැබීම තීරණය කිරීමට එය සමත් වන හෙයිනි.

දෘශ්‍යාබාධ ඇති පුද්ගලයන්ට කණ්නාඩි සහ සුදු සැරයටි අවශ්‍ය විය හැකිය. කණ්නාඩිවලින් තමනට උපකාරයක් ලැබෙනු ඇතැයි සිතූ පුද්ගලයන්ගෙන් ඒවා ලැබී තිබුනේ 64% ට පමණක් වන අතර විශාල සංඛ්‍යාවකට සුදු සැරයටි අවශ්‍ය වී ඇත.

ආධාරක උපකරණ අවශ්‍ය තරමින් ලබා ගැනීමට නොහැකි වීම නිසා, එම උපකරණ ලබා ගතහැකි වීම වැඩි කිරීමේ උපායමාර්ග වෙනම අංශ පිළිබඳ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයට ඇතුළත් කොට ඇත.

## 5 සමාජයේ සහ පවුල්වල අපේක්ෂා

ආබාධ ඇති තැනැත්තන් අසරණ හෝ උපකාර ලැබිය යුතු පුද්ගලයන් ලෙස පවුල් හෝ සමාජය විසින් බොහෝ විට සලකනු ලැබේ. මෙම නිශේධාත්මක ආකෘතිගත කිරීම විවිධ සමාජ - ආර්ථික ප්‍රතිඵල ඇති කිරීමට හේතු වී ඇත. ලැබෙන ඉඩප්‍රස්ථාවලින් පවා ප්‍රයෝජන නොගෙන සිටීමට පුද්ගලයන් සහ පවුල් දක්වන හේතු සහ විශ්වාස ලෙස මෙය පිළිබිඹු වේ.

ආබාධ ඇති ළමුන් සහ වැඩිහිටියන් කෙරෙහි මෙම විශ්වාස හා ආකල්පවල බලපෑම නිසා, ඔවුන් තුළ අභිප්‍රේරණය නොමැති වී, සිය ස්වශක්තිය සහ හැකියාවන් දියුණු කර ගැනීමේ ඉඩප්‍රස්ථා සුලු ප්‍රමාණයක් ඇති කිරීමට හේතු වේ. වැඩිහිටියන්ව නිවසේ නඩත්තු කෙරේ. ආබාධ ඇති වැඩිහිටියන් වෙනත් වැඩිහිටියන් මෙන් වැඩ කිරීමට සහ පවුලේ ආදායමට දායක වීමට කැමැත්තක් දක්වන බව හෝ විවාහ වී තමන්ගේම පවුලක් හදා ගැනීමේ අවශ්‍යතාව ඔවුන් තුළ ඇති බව අවබෝධ කර ගැනීම සිදු වන්නේ කලාතුරකිනි. තම ආබාධිත බව පිළිබඳව හෝ මෙරටේ පුරවැසියන් වශයෙන් තම අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දැන ගැනීමට ඔවුනට ඉඩප්‍රස්ථා ලැබෙනුයේ මඳ වශයෙනි. සිය ආබාධිතබ සහ තම අයිතිවාසිකම් පිළිබඳව දැනීම වැඩි දියුණු කර ගැනීමට උපකාර විය හැකි පාඨමාලාවනට හෝ වැඩමුළුවලට සහභාගිවීමට ඉඩප්‍රස්ථා ලැබී තිබුණේ, ආබාධ සහිත පිරිමින්ගෙන් සහ කාන්තාවන්ගෙන් 7% කට පමණි.

මෙම භෞතික සහ සන්නිවේදන බාධක, සංස්කෘතික බාධක සහ පවුල් හා සමාජ අපේක්ෂා නිර්මාණය කරනු ලැබ ඇත්තේ නිශේධාත්මක සමාජ හැසිරීම් මගිනි. යම් යම් මුල් බැස ගත් ආකල්ප බාහිරව ප්‍රකාශ වීමක් මෙම නිශේධාත්මක හැසිරීම් මගින් සිදු වේ. සමාජය විසින් සමස්තයක් වශයෙන් සහ පුද්ගලයන් වශයෙන් එම ආකල්ප අසාධාරණ බව අවබෝධ කරගෙන හා පිළිගෙන, අවශ්‍ය වෙනස ඇති කිරීමේ වගකීම භාර ගත් විට, එකී ආකල්පය ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා බලපෑම් කරනු ඇත. මෙම ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ දී සෘජු කොටස්කරුවන් වශයෙන් සියලු රාජ්‍ය අංශ සහ සමාජ කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමේ හේතුව පසුපස ඇති දර්ශනය වන්නේ මෙයයි.

## IV ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගත හැකි සම්පත්

මෙම ප්‍රතිපත්තිය සැකසීමේ දී අපේ රට මූල්‍ය සම්පත් හිග සංවර්ධනය වන්නා වූ රටක් ය යන කරුණ කෙරෙහි නිසි සැලකිල්ල දක්වන ලදි. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලබන කිසියම් අංශයක, ආයතනයක හෝ සංවිධානයක තිබෙන මට්ටමේ ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදම්වලට දරා ගත නොහැකි වන්නා වූ පිරිවැය අයත් වන ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත. සංවර්ධන සහයෝගිතාව මගින් ලබා ගත හැකි අතිරේක අරමුදල් කිසිවක් වේ නම්, එවැන්නක් අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කිරීමේ වේගය වැඩි කරනු ඇත.

යටිතල ව්‍යුහය සහ මානව සම්පත් සමගින් විමධ්‍යගත පරිපාලනයක් තිබීම අතින් අප සතුව වෙනත් සම්පත් රාශියක් තිබීම කෙරෙහි ද සැලකිල්ල යොමු වී ඇත. ආබාධ ඇති තැනැත්තන්ට සාධාරණත්වය සැලසීම සඳහා සහ ප්‍රධාන ධාරාවේ ඔවුන් ඇතුලත් කිරීම සඳහා අප සතුව පවත්නා මෙම සම්පත් උපරිම ආකාරයෙන් භාවිත කිරීම පිණිස ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස්කොට ඇත. මේ අතින් ප්‍රතිපත්තිය අවශ්‍යයෙන් ම අයිතිවාසිකම් මත පදනම් වූ සහ සම්පත් මත පදනම් වූ එකක් වේ.

ලබා ගත හැකි සම්පත් මෙම ලේඛනයේ දෙවන කොටසේ "ක්‍රියාත්මක කිරීමේ සහකරුවන්" යනුවෙන් හඳුන්වා ඇත. කෙටියෙන් ඒවා වන්නේ,

- රාජ්‍ය අංශයේ යටිතල ව්‍යුහය සහ මානව සම්පත් සමග පවරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- මූලික කොටස්කරුවන් ලෙස ආබාධ ඇති තැනැත්තන් සහ ඔවුන්ගේ සංවිධාන හා දෙමාපිය කණ්ඩායම්
- සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ආබාධ ඇති තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය
- සංවර්ධනය එල්ලය කර ගත් රාජ්‍ය නොවන සංවිධානවල පුළුල් ජාලය
- සමාජ වගකීම් පිළිබඳ ව වැඩි වැඩියෙන් සවිඥානකතාවක් ඇති පෞද්ගලික අංශයක්
- සමාජ වගකීම පිළිබඳ හැකියාවක් ඇති සිවිල් සමාජය
- සමාජ සජීවීකරණය කිරීමේ හැකියාවක් ඇති ජනමාධ්‍ය

සාරාංශය: ජනතා සහභාගිත්වය නොමැති සංවර්ධනයක් තිබිය නොහැකි බව ශ්‍රී ලංකාව හොඳින් දනී. ජනතාව තමන්ගේ ම සංවර්ධනයට සහභාගී වන්නා වූ සහ සිය සමාජ ආර්ථික තත්ත්වය නගා සිටවීමට ප්‍රයත්න දරන්නා වූ විශාල දැනුම් සම්භාරයක් අප ප්‍රජාව සතුව දැනටමත් ඇත. ආබාධිතබව පිළිබඳ මෙම ප්‍රතිපත්තියෙහි දක්වා ඇති බොහෝ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ මාර්ගයක් වශයෙන්, ප්‍රජා මූලික පුනරුත්ථාපනය වර්ධනය කිරීම සඳහා බොහෝ ක්ෂේත්‍රවල බොහෝ ප්‍රජාවන් තමන්ගේ ම සම්පත් යොදා ගනිමින් සිටිති. තමන්ට දැනටමත් තිබෙන්නා වූ සම්පත් මොනවාදැයි සහ ඒවා යොදා ගන්නා ආකාරය ප්‍රජාව දනිති. තම දෛනික ජීවිකාව උපයා ගැනීම සඳහා භාවිත කරන දැනුම සහ නිපුණතා, ප්‍රජා ජීව ගුණය, සහ සිය ජීවිත වැඩි දියුණු කර ගැනීම සඳහා එක්ව වැඩ කිරීමේ අත්දැකීම එවැනි සම්පත්වලට ඇතුලත් වේ. මීතුරන්, අසල්වැසියන් සහ ප්‍රජා සාමාජිකයන් වශයෙන් එකිනෙකා කෙරෙහි පවත්නා වගකීම් පිළිබඳව ඔව්හු දැන සිටිති. සමහර ප්‍රජාවන් කොටස්වලට කැඩිගොස් සබඳතාවන් බිඳීගොස් තිබිය හැකි වුව ද, ආබාධිතබව වූකලී පොදු ප්‍රශ්නයක් වන අතර විවිධ කොටස් ඒකරාශී කිරීමට නිතරම උපකාරී වන එකක් වේ.

# දෙවන කොටස

# මූලධර්ම, ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

## v. ප්‍රතිපත්ති මූලධර්ම

❖ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් සාධාරණත්වය

*"නීතිය පැසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය"*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

❖ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් වශයෙන් අන්තර්කරණය.

*"එක්සත් ජාතීන්ගේ ජනතාව වන අපි, මූලික මිනිස් අයිතිවාසිකම් කෙරෙහි මිනිසාගේ අභිමානයේ සහ වටිනාකම් කෙරෙහි සහ පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් කෙරෙහි විශ්වාසය යළි තහවුරු කරන්නෙමු"*

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, 1945 ජූනි මස 26 වන දින

❖ රජයේ වගකීම

*"තම රටේ පොදු සේවාවන්වලට ප්‍රවේශය ලැබීම සඳහා සෑම පුද්ගලයෙකුටම අයිතිය ඇත්තේය"*

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, 1948 දෙසැම්බර් මස 10

❖ ආබාධ ඇති තැනැත්තන්, ඔවුන්ගේ සංවිධාන සහ දෙමාපිය සංවිධාන බලගැන්වීම.

*"සිය සිවිල් දේශපාලනික ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නා වූ සියලු ක්‍රියාමාර්ගයන් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ආබාධ ඇති තැනැත්තන් සහ ඔවුන්ගේ දෙමාපියන්, රැකවල්කරුවන්, බලපෑම් කරන්නන් සහ සංවිධාන, රාජ්‍යයන් සමග ක්‍රියාකාරී හවුල්කරුවන් විය යුතු බව යළි තහවුරු කරමින්"*

ආබාධ සහිත තැනැත්තන් සඳහා ඉඩප්‍රස්ථා සමාන කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මත රීති 1993 දෙසැම්බර් මස 20 දින

❖ සිවිල් සමාජයෙහි සහභාගි වීම.

*"සියලු මිනිසුන් නිදහස්ව උපත ලබන අතර, අභිමානය හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාන වෙති. ඔව්හු තර්කය හා හෘදය සාක්ෂිය උරුමව සිටින අතර සහෝදරත්ව පිළිගුණයෙන් යුතුව අන්‍යෝන්‍යයා කෙරෙහි පැවතිය යුතුය"*

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය 1948 දෙසැම්බර් මස 10 දින

## VI. අන්තර්කරණය සඳහා අංශ පිළිබඳ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග

### 1 රැකියා

කාන්තාවන් හා පිරිමින් ද අයත් ආබාධ ඇති තැනැත්තන්ට සිය වැඩ කිරීමේ අයිතිය ලැබෙනු ඇත.

(1) ඔවුනට රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා නිදහස් ව තෝරා ගත හැකි වනු ඇත.

මේ සඳහා,

- රැකියාවේ දී සහ රැකියා උපකාර සේවාවන්හි දී, ඔවුන් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුතුය. විධිමත් සහ අවිධිමත් අංශයන්හි වැටුප් ලබන රැකියා හෝ ස්වයං රැකියා සඳහා දත්ත බැංකු ඇතුළු රැකියා ස්ථාපන සේවාවන්හි දී සමාන ඉඩප්‍රස්ථා ඔවුනට තිබිය යුතුය.

- දිරිගැන්වීම් සැපයීම මගින් සිය ශ්‍රම බලකාය තුළ ආබාධ ඇති තැනැත්තන් පිළිගැනීම සඳහා සේවා යෝජකයන්ට හැකියාව ලබාදෙන පරිසරයක් ඇති කරනු ලැබේ. එවැනි දිරිගැන්වීම්, බදු සහන හෝ වෙනත් රටවල සාර්ථක ලෙස භාවිතකොට ඇති වෙනත් ක්‍රමවල ස්වරූපය ගනු ඇත.

- සේවා යෝජකයින් විසින් සේවා ස්ථානය තුළ ආබාධිතබව පිළිබඳ ගැටලු කළමණාකරණය කිරීම සඳහා උපාය මාර්ගයක්, තමන්ගේ සමස්ත සංවිධාන ප්‍රතිපත්තියෙහි අනුබද්ධිත කොටසක් වශයෙන් සහ ව්‍යාපාරික සාර්ථකභාවයට දායක වන්නක් වශයෙන් යොදා ගනු ඇත. සේවක උපකාර වැඩසටහන් පවතින්නේ නම්, ඒවාට උපාය මාර්ගය සම්බන්ධ කරනු ඇත.

- සේවා කොන්දේසි, පාරිශ්‍රමික, අඛණ්ඩ පුහුණුව සහ දිවි පුරා ඉගෙනුම සහ ප්‍රවාහනය හා නිවාස වැනි වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභ සම්බන්ධයෙන්, ආබාධ ඇති තැනැත්තන් ආබාධ නැති සේවකයන් සමග එක සමාන ලෙස සැලකීම සේවා යෝජක උපාය මාර්ග මගින් සහතික කරනු ලැබේ.

- රැකියා සඳහා සමහර අයදුම්කරුවන් සලකා බැලීමේ දී, ආබාධ ඇති තැනැත්තන්ට සිය හැකියාව යොදා ගනිමින් රැකියාවේ කටයුතු කිරීමට හැකියාව ලබා දීම පිණිස සේවා යෝජකයන් විසින්, වැඩපලෙහි සරල සහ අවශ්‍ය ගැලපීම් සහ වෙනස් කිරීම් කිරීම සහ සේවා ස්ථානය හා වැඩ ක්ෂේත්‍රය තුළ සන්නිවේදනය සහ ප්‍රවේශ පහසුකම් වැඩි කිරීම කරනු ඇත.

- ආබාධ ඇති තැනැත්තකු වහාම සේවයේ යොදවා ගැනීමට සේවා යෝජකයන්ට නොහැකි වන අවස්ථාවල දී, රැකියා සොයන ආබාධ ඇති තැනැත්තන්ට වැඩ පදනම් වූ අත්දැකීම් සැපයීම පිළිබඳව සලකා බැලීමට සේවා යෝජකයන්ට හැකිය. මෙය සේවා ස්ථානයෙහි සුවිශේෂී රැකියාවක් සඳහා අවශ්‍ය වන්නා වූ නිපුණතා, දැනුම සහ වැඩ ආකල්ප අත්කර ගැනීමට රැකියා සොයන්නාට හැකියාව ලබා දෙනු ඇත. රැකියාව ලැබෙන අවස්ථාව වන විට සේවා යෝජකයාගේ අවශ්‍යතාවලට අදාළ වන නිපුණතා අත් කර ගැනීමට එවැනි සේවා ස්ථාන අත්දැකීම්, රැකියා සොයන්නාට උපකාර වනු ඇත.

- වෙනත් තත්ත්වයන් හි දී ආබාධ ඇති සේවකයන්ට තම නිවසින් පිටත් වී සේවා ස්ථානයට පැමිණිය නොහැකි විය හැකිය. සේවකයාට මෙන් ම සේවා යෝජකයාට ද ප්‍රයෝජනවත් වන්නා වූ කාර්යයන් තෝරා ගනිමින්, සුදුසු වැඩ සඳහා කොන්ත්‍රාත් දීමේ හැකියාව සේවා යෝජකයා විසින් සලකා බලනු ඇත.

- ආබාධ ඇති රැකියා සොයන්නන්ගේ හැකියාවට, වැඩ කිරීමේ හැකියාවට සහ උනන්දුවට ගැලපෙන රැකියා සඳහා ඔවුන් සලකා බැලීමේ දී, ලබාගත හැකි උපදේශන සහ මාර්ගෝපදේශ සේවාවන් සමග සේවා යෝජකයින් සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

- ආබාධ ඇති තැනැත්තන් සේවයේ යෙදවීමේ හැකියාව, නිදසුනක් වශයෙන් කළමණාකරණ සහ තාක්ෂණික තනතුරුවලට නිපුණතා අභියෝග්‍යතා සහ සුදුසුකම් ඇති ආබාධ ඇති තැනැත්තන් පත් කිරීමේ හැකියාව පිළිගැනීම ප්‍රවර්ධනය කරනු ඇත.

- සේවා යෝජකයන් සහ සේවකයන් අතර නිශේධාත්මක ප්‍රතිරූප හා ආකල්ප දුරලීම මගින්, ආබාධ ඇති තැනැත්තන්ට රැකියා ඉඩප්‍රස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා සහ රැකියාවෙහි නිරතව සිටිය දී ආබාධිත බව ඇතිවන අය සඳහා රැකියා අත්නැර නබා ගැනීම සඳහා බලපෑම් කරන්නන් වශයෙන් සිය සාමාජිකයන් අතර කටයුතු කිරීමට සේවා යෝජක සංවිධාන සහ වෘත්තීය සමිති ක්‍රියා කරනු ඇත.

- ආබාධිත බව සේවක අධ්‍යාපනයෙහි මොඩියුලයක් වශයෙන් ඇතුළත් කරනු ලබන අතර, එමගින් ආබාධ ඇති සිය සහෝදර සේවකයන් පිළිගැනීම වැඩි වනු ඇත.

- උපදේශන සහ මාර්ගෝපදේශ වැනි රැකියා ස්ථාපන සහ උපකාර සේවාවන්හි නිරත වන්නන් ආබාධ ඇති තැනැත්තන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා සූදානම් කරනු ලැබේ.

- බඳවා ගැනීමේ ක්‍රියාවලි මගින්, සුදුසුකම් ඇති ආබාධ ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් හැකි තරම් බොහෝ ප්‍රමාණයක් ලබා ගැනීම දිරිමත් කරනු ඇත.

(2) ආබාධ ඇති තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ වැඩ ඉඩප්‍රස්ථා ඇති කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, මෙම ලේඛනයෙහි දක්වා ඇති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම පිණිස, ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් පොදු වේදිකාවක් ස්ථාපනයකොට පවත්වාගෙන යනු ඇත. ඔවුන්ගේම සාමාජිකත්වය හා කළමණාකරණය මෙන් ම ආබාධිතබව පිළිබඳ සංවිධාන හා වෘත්තීය සමිති හා අදාළ රාජ්‍ය අංශ ද මෙම පොදු වේදිකාවෙහි නියෝජනය වනු ඇත

(3) ව්‍යවසායකත්ව පුහුණුව, සුළු පරිමාණ ණය හා ව්‍යාප්ති සහ අලෙවි වැඩසටහන් ඇතුළු ස්වයං රැකියාවලට පහසුකම් සැපයීමේ හා ආධාර කිරීමේ වැඩසටහන්වලට සහ ව්‍යාපෘතිවලට, ආබාධ ඇති තැනැත්තන්ගේ සාධාරණ අනුපාතයක් ද ඇතුළත් වනු ඇත.

## 2 වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය

විධිමත් සහ අවිධිමත් අංශයේ වේතන උපයන රැකියාවෙහි හෝ ස්වයං රැකියාවෙහි ප්‍රමාණවත් ආදායමක් ඉපයීම සඳහා පුද්ගලයකු සතු හැකියාව සෑහෙන ප්‍රමාණයකින් වැඩි කිරීමට වෘත්තීය නිපුණතා සතුව සිටීම හේතු වේ.

(1) පිරිමින් හා කාන්තාවන් යන දෙකොටසම ඇතුළත් ආබාධ ඇති තරුණ පුද්ගලයන් සහ වැඩිහිටියන්, ප්‍රධාන ධාරාවේ වෘත්තීය පුහුණුවීම්වල දී සහ නිපුණතා සංවර්ධන වැඩසටහන්වල දී, වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකළ යුතුය.

ප්‍රධාන ධාරාවේ වෘත්තිය පුහුණුවීම්වල දී සහ නිපුණතා සංවර්ධයේ දී, සමාන ඉඩප්‍රස්ථා සලසන බවට පහත සඳහන් උපාය මාර්ග සහතික කරනු ඇත.

- අයදුම්කරුවන් සහ පුහුණුවන්නන් විසින් අවශ්‍ය ප්‍රවේශ නිර්ණායක සහ කොන්දේසි සපුරාලන්නේ නම්, වෘත්තිය පුහුණුවීම් සහ නිපුණතා සංවර්ධනය සඳහා ආබාධිතබව බාධකයක් නොවනු ඇත

- වෘත්තිය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ සිය තේරීමේ යෝග්‍යතාව පිළිබඳව සහ අනාගත ජීවිකා උපයීමේ ක්‍රමය පිළිබඳව, ආබාධ ඇති අයදුම්කරුවන්ට ඔවුන් කැමති වන්නේ නම්, ලබාගත හැකි වෘත්තීය උපදේශන සහ මාර්ගෝපදේශ මගින් උපදෙස් දෙනු ඇත.

- වෘත්තිය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී, අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ආබාධිතබවට වඩා, අයදුම්කරු/ අයදුම්කාරිය කැමති විශේෂිත නිපුණතාවට අදාල පුහුණුව ලබා ගැනීමට ඔහුට ඇයට ඇති හැකියාව කෙරෙහි සැලකිල්ල දක්වනු ලැබේ.

- ව්‍යවසායකත්ව පුහුණුව ඇතුලු වැටුප් ලබන රැකියා සහ ස්වයං රැකියා සඳහා ලබාගත හැකි ස්ථාපන සහ රැකියා උපකාර සේවාවන් සඳහා ආබාධ ඇති තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් ලැබෙනු ඇත.

- වෘත්තිය පුහුණු ආයතනවල සහ නිපුණතා සංවර්ධන වැඩසටහන්වල කාර්ය මණ්ඩල ආබාධ ඇති තැනැත්තන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා සූදානම් කරනු ලැබේ.

- ආබාධ ඇති තැනැත්තන්ගේ විශේප අවශ්‍යතා සපුරාලීම සඳහා, අවශ්‍ය අවස්ථාවන්හි දී, පුහුණු අවස්ථාවන්ට ප්‍රවේශ පහසුකම් යෝග්‍ය ලෙස සකස් කිරීම සහ සන්නිවේදන සඳහා පහසුකම් සැලසීම් සිදු කරනු ලැබේ.

- නිදසුනක් වශයෙන් යෝග්‍ය නිපුණතා, අභියෝග්‍යතා සහ සුදුසුකම් ඇති ආබාධ ඇති තැනැත්තන් පුහුණු උපදේශකවරුන් සහ වෙනත් කාර්ය මණ්ඩලවල සේවයේ යෙදවීම මගින් ආබාධ ඇති තැනැත්තන් සේවයෙහි යෙදවීමේ හැකියාව පිළිගැනීම ප්‍රවර්ධනය කරනු ලැබේ.

(2) ඉතා බරපතල ආබාධ හේතුකොටගෙන ඉතා විශේෂ අවශ්‍යතා ඇති සහ ප්‍රධාන ධාරාවේ ආයතනවලට ඇතුළත් කළ නොහැකි පුද්ගලයන් ඇතුළත් කර ගැනීම සඳහා, දැනට ආබාධ ඇති තැනැත්තන්ට පමණක් පුහුණුව සළසන වෘත්තීය පුහුණු කිරීමේ ආයතන යෝග්‍ය ලෙස අනුවර්තනයකොට වර්ධනය කරනු ලැබේ.

## 3 දිළිඳුබව දුරලීම

'දිළිඳුබව තුරන් කරලීම එකම මග ආදායම් වැඩිකිරීම් සහ ස්ථාවර කිරීම් පමණක්ම නොවේ. විධිමත් හෝ අවධිමත් අංශයේ රැකියා තිබීම ආර්ථික හේතු මත අත්‍යවශ්‍ය වන්නාක් මෙන් ම, එය පුද්ගලයන්ගේ ගරුත්වය සහ ආත්ම අභිමානය සුරැකීම සහ ප්‍රවර්ධනය කරනු ලබන ආර්ථික අයිතිවාසිකමක් ද වේ. දිළිඳුබව තුරන් කරලීම සඳහා පුද්ගලයකුගේ සහ ඔහුගේ/ඇයගේ පවුලේ දෛනික අවශ්‍යතා සපුරාලීම පිණිස ප්‍රමාණවත් ආදායමක් සමග අත්‍යවශ්‍ය වන අනෙකුත් සාධක අතර, අධ්‍යාපනය, ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම්, පෝෂණය සහ නිවාස පවතී. මෙම සේවාවන් සහ වැඩසටහන් සඳහා පුද්ගලයන්ට ඇති අයිතිවාසිකම් මෙම ප්‍රතිපත්තියේ වෙනත් තැනක ඇතුළත් කරනු ලැබ ඇත.

අන් තැනක ඇතුළත් කර ඇති පුද්ගලයන් හැර, ආබාධ ඇති සහ පිළිගත් දුගී රේඛාවට පහළින් සිටින්නා වූ පුද්ගලයන් පහත සඳහන් වැඩසටහන්වලට ඇතුළත් කරනු ලැබේ.

- දිළිඳු පුද්ගලයන් ආර්ථික, සමාජ සහ දේශපාලන වශයෙන් බලගැන්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සියලු දිළිඳුබව තුරන් කරලීමේ වැඩසටහන්.

- ආදායමක් නොමැති හෝ අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා ක්‍රියාත්මක කරන ලද ඉතිරි කිරීම්, නිපුණතා පුහුණුව, ව්‍යවසායකත්ව පුහුණුව, සුළු පරිමාණ ණය සහ ව්‍යාප්ති හා අලෙවි වැඩසටහන් ඇතුළු ආදායම් ඉපයීමේ වැඩසටහන්.

- සමාජ සුරක්ෂිතතා ජාලය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන්

## 4 පාසල් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපන ආඥාපණත යටතේ, ආබාධ ඇති ළමුන්ට වෙනත් සියලු ළමුන්ට මෙන් අධ්‍යාපනය සඳහා සමාන අයිතිවාසිකම් ඇත

ළමයාගේ අධ්‍යාපනය, ඔහුගේ ඇයගේ පෞද්ගලිකත්වය, දක්ෂතා සහ මානසික හා ශාරීරික ශක්නුතා, ඒවා යොදා ගත හැකි ප්‍රශස්ත මට්ටමින් වර්ධනය කිරීම අරමුණු කර ගත යුතු බව (ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 29 වන ව්‍යවස්ථාව සඳහන් කරයි. අධ්‍යාපනය මගින් සිය සමාජයේ වගකීම් සහිත ජීවිතයක් සඳහා ළමයා සූදානම් කළ යුතු බව සහ අන්‍ය සියලු පුද්ගලයන් සඳහා සහ ස්වාභාවික පරිසරය සඳහා ගෞරව කිරීමේ සාරධර්ම අත්කර ගැනීම සඳහා ඔවුනට හැකියාව ලබා දිය යුතු බව ද එය වැඩිදුරටත් සඳහන් කරයි.

මෙම සන්දර්භය තුළ, ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය සඳහා අයිතිවාසිකම ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම පිණිස පහත සඳහන් උපාය මාර්ග භාවිත කරනු ලැබේ.

*අන්තර්කරණ අධ්‍යාපනය ආයතනගත කිරීම*

- "විශේෂ අධ්‍යාපනය" යන වදන් භාවිත කිරීම ආබාධ ඇති ළමුන් තවදුරටත් කොන් කිරීමට සහ ඔවුන් වෙන් කිරීමට සහ වෙන්කර තැබීමට උපකාරී වෙයි. "සියලු දෙනා සඳහා එක් පාසල් ක්‍රමයක්" යන දර්ශනයට අනුව කටයුතු කරමින් අන්තර්කරණය සහ සාධාරණත්වය පිළිබඳ සංකල්ප ගෙන එන. "අන්තර්කරණ අධ්‍යාපනය" ලෙස 'විශේෂ අධ්‍යාපනය' යන වදන් වෙනස් කරනු ලැබේ.

- ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතු හැකියාව, ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සහිත විශේෂ ඒකකයක් තුළ සහතික කළ යුතු වේ. විධිමත් පාසල් ක්‍රමය තුළ වූ අමාත්‍යංශයේ දෙපාර්තමේන්තුවක් තුළ මෙම "අන්තර්කරණ අධ්‍යාපන ඒකකය" තිබිය යුතු අතර, පාසල් අධ්‍යාපනයේ සියලු මට්ටම්වල ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය අධීක්ෂණය කිරීම එයට කළ හැකිය. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්ති, සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීමේ විස්තර, ආබාධ ඇති ළමුන්ට සපයනු ලබන අධ්‍යාපනයේ ගුණය සහ කාර්යක්ෂමතාව නියාමනය කිරීම සම්බන්ධ කාර්යයන් මෙම "අන්තර්කරණ අධ්‍යාපන ඒකකය" විසින් ඉටු කරනු ලැබේ.

*ආබාධිතබව තක්සේරු කිරීම, වාර්තා කිරීම සහ සොයා ගැනීම*

- 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව, ප්‍රාථමික පාසලට ඇතුල් වන සෑම ළමයෙක් ම දෙමාපියන්ගේ සහභාගිත්වය ඇතිව, වෛද්‍ය නිලධාරියකු සහ පන්ති භාර ගුරුවරයා විසින් තක්සේරු කිරීම සහ ළමයා ප්‍රාථමික අධ්‍යාපනය නිම කරන තෙක් එක් එක් ළමයාගේ අඛණ්ඩ සහ සමුච්චිත වාර්තා ලෙස මෙම තක්සේකරු කිරීම් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මෙම සම්මත තක්සේරු සහ වාර්තා ආකෘති පත්‍රය මගින්, ආබාධ ඇති ළමුන් පැහැදිලිව හඳුනා ගැනීම සඳහා ඉඩකඩ සපයයි. මෙය ආබාධ ඇති එක් එක් ළමයාට ප්‍රතිලාභ ලැබෙන්නා වූ ළමා කේන්ද්‍රීය උගැන්වීම් ක්‍රම භාවිත කිරීමට ගුරුවරයාට හැකියාව ලබා දෙයි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන්නා වූ දැනුම, නිපුණතා සහ ආකල්ප ගුරුවරයාට ලබා දී, ආබාධ ඇති ළමයාගේ ඉගෙනීමේ හැකියාව පන්ති කාමරයේ දී උපරිම කරගන්නා බවට සහතික කරලීම අවශ්‍ය වේ.

- ආබාධ ඇති ළමුන් හෝ ආබාධ ඇති වීමේ අවදානමට මුහුණ දී ඇති ළමුන්, දෙමාපිය සහභාගිත්වය ඇතිව කලින් හඳුනා ගැනීමට හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය ක්‍රමය වෙත යොමු කිරීමට පාසල් ගුරුවරුන්ට සහ පාසල් වෛද්‍ය සේවාවට හැකියාව තිබෙන බව සහතික කළ යුතු වේ.

*ගුරු පුහුණුව*

- ආබාධ ඇති ළමුන්ට අධ්‍යාපනයක් ලබා දීම සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරුන් සූදානම් කිරීම පිණිස, සියලුම ජාතික අධ්‍යාපන පීඨවල එම ගුරුවරුන්ගේ පූර්ව සේවා පුහුණුවට ආබාධ ඇති ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මොඩියුලයක් ඇතුළත් කළ යුතුය.

- මෙය ඒ සමගම ද්විතියික අධ්‍යාපන මට්ටමට ද ව්‍යාප්ත කළ යුත්තේ, එම මට්ටම්වල දී පාසලින් ගිලිහී යාම අඩු කිරීම සඳහා වැදගත් පියවරක් එමගින් ගත හැකි වන හෙයිනි.

- "ආබාධ ඇති ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය" පිළිබඳ පූර්ව සේවා පුහුණු පාඨමාලාවක් මීරිගම පිහිටි හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ආරම්භ කර ඇත. සමස්ත දිවයින ආවරණය වන පරිදි මෙම ප්‍රවීණතාව ඇති ගුරුවරුන් අවශ්‍ය සංඛ්‍යාව තක්සේරු කළ යුතුය. මෙම පාඨමාලාව ඉන්පසු ප්‍රාදේශීය පදනමක් මත තෝරා ගනු ලැබූ වෙනත් අධ්‍යාපන විද්‍යා පීඨවලට ද ව්‍යාප්ත කළ යුතු අතර, එමගින් අනාගතයේ දී අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සම්පත් ගුරුවරුන් දිවයින පුරා සිටිය හැකිය.

- ගුරු මධ්‍යස්ථානවල සියලු කාර්ය මණ්ඩලවලට අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ දැනුමක් තිබිය යුතු අතර, අඛණ්ඩ අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන් විසින් කරනු ලබන අවශ්‍යතා හඳුනා ගැනීමේ කාර්යාවලි තුළ ආබාධ ඇති ළමුන් පිළිබඳ ප්‍රශ්න ඇතුළත් විය යුතුය. සියලු ගුරුවරුන් විසින් හදාරනු ලබන අඛණ්ඩ අධ්‍යාපනයේ මොඩියුලයක් වශයෙන් "ආබාධ ඇති ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය" සහ එහි ක්‍රමවත් යාවත්කාල කිරීම් ඇතුළත් කරනු ලබන බවට රට පුරා පිහිටුවා ඇති සියලු ගුරු මධ්‍යස්ථාන විසින් සහතික කළ යුතු වේ.

- අධ්‍යාපන පරිපාලකයන්ට සහ පාසල් විදුහල්පතිවරුන්ට ලබා දෙන පුහුණුවට "අන්තර්කරණ අධ්‍යාපනය" පිළිබඳ යෝග්‍ය මොඩියුල ඇතුළත් කළ යුතුය.

*ජාතික අධ්‍යාපන ආයතනය*

- ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විශාල දායකත්වයක් සපයා ඇත. ප්‍රාථමික අධ්‍යාපන අංශය තුළ මෙම කාර්යය ඉටු කරනු ලබන කාර්ය මණ්ඩල දැනට හඳුන්වනු ලබන්නේ "විශේෂ අධ්‍යාපනය" තුළ සිටින්නන් වශයෙනි. මෙම නාමය "අන්තර්කරණ අධ්‍යාපනය" ලෙස වෙනස් කිරීමෙන් ඔවුන්ගේ සමෝධානය සහ පාසල් ගුරු පුහුණු ක්‍රමය තුළ ඔවනුගේ වැඩ පහසු කරනු ඇත.

- මේ දක්වා මෙම අධ්‍යාපන අංශය විසින් කරගෙන යනු ලැබූ කාර්යයන් ඉදිරියට කරගෙන යාම සඳහා නොකඩවා ඉදිරිපත් වන විශාල ඉල්ලුම සපුරාලීම පිණිස, අන්තර්කරණ අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ සේවක සංඛාව ප්‍රමාණවත් මට්ටමකින් පවත්වාගෙන යනු ඇත.

මේවාට පහත සඳහන් දෑ ඇතුළත් වේ

- ප්‍රාථමික අධ්‍යාපනය සහ "අන්තර්කරණ අධ්‍යාපනය" පිළිබඳ සේවාස්ථ උපදේශකයින්ට "පුහුණු කරන්නන් පුහුණු කරන්නන්" වශයෙන් මූලික හා අඛණ්ඩ අධ්‍යාපනයක් ලබා දීම.
- "අන්තර්කරණ අධ්‍යාපන" කලාප නිළධාරීන්ට පරිපාලනය සහ පසු විපරම් සහය සහ නියාමනය සැපයීම පිළිබඳ පුහුණුවක් ලබා දීම.
- මෙම සේවක මණ්ඩල මෙන් ම ගුරුවරුන් සහ මෙම පුහුණුකරුවන් විසින් පුහුණු කරනු ලබන වෙනත් සේවක මණ්ඩල පුහුණු කිරීම සඳහා විෂය මාලා සකස් කිරීම.

- ජාතික අධ්‍යාපන පීඨවල "අන්තර්කරණ අධ්‍යාපනය" පිළිබඳ විශේෂඥයින් හෝ සම්පත් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා විෂයමාලා සකස් කිරීම.

- මෙම සියලු කණ්ඩායම් සඳහා උගැන්වීමේ, ඉගෙන ගැනීමේ ද්‍රව්‍ය සකස් කිරීම.

- 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සහ අනාගත ප්‍රතිසංස්කරණවලට සහ ප්‍රතිපත්තිවලට අනුකූලව, උගැන්වීම් - ඉගෙනුම් ද්‍රව්‍ය සියලු ළමුන් විසින් භාවිත කරනු ලබන බව සිත්හි තබා ගනිමින්, ආබාධ ඇති පාසල් ළමුන්ගේ විශේෂ ගැටලු නිරාකරණය කිරීම පිණිස උගැන්වීම් ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම.

අදාළ වන අවස්ථාවන් හි දී ජාතික අධ්‍යාපන ආයතනය විසින්, කිසියම් විශේෂිත පාඨමාලා ද්‍රව්‍යයක් සමාලෝචනය කිරීම සඳහා යෝග්‍ය ආබාධිත බව පිළිබඳ සංවිධානවලින් සහයෝගය අපේක්ෂා කරනු ඇත.

නව ද ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, පාසල් ක්‍රමය තුළ වෙනස්කම් සහ ආබාධ ඇති ළමුන්ගේ වෙනස් වන ගැටලු පිළිබිඹු කරමින්, කෙරීගෙන යන ක්‍රියාකාරකමක් වශයෙන් එම සියලු ද්‍රව්‍ය සහ සියලු පුහුණු කිරීමේ පරිපාටි ක්ෂේත්‍ර පරීක්ෂණවලට ලක් කොට සංශෝධනය කෙරෙනු ඇත.

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීමට දායක වී ඇති ක්‍රියාවන් මුල් කර ගත් පර්යේෂණ කරගෙන යයි. මෑතකදී සිදුකල පාසල් සමීක්ෂණ විග්‍රහවලින් ඉදිරිපත් කරන ලද දීර්ඝ කාලීන පර්යේෂණ සහ නිර්දේශ සඳහා විශේෂිත ක්ෂේත්‍ර දෙකක් වන්නේ, පාසල් අධ්‍යාපනයේ සියලු මට්ටම්වල දී ගිලිහී යාමේ අනුපාත සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විෂමතාවන් වේ

*දෙමාපියන්ගේ හා ප්‍රජාවගේ කාර්ය භාරය*

- 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව, පාසල සහ එමගින් සපයනු ලබන අධ්‍යාපනය දියුණු කර ගැනීම සඳහා සම්පත් වශයෙන් දෙමාපියන් හා ප්‍රජාව තවදුරටත් තෝරා ගනු ලැබ ඇත. ඔවුහු සංස්කෘතික සන්දර්භයක් තුළ සමාජ සේවය සැලසීමේ සම්ප්‍රදායික කාර්ය භාරය ද ඉටු කරති. ආබාධ ඇති ළමුන්ගේ දෙමාපියන්ට ද මෙහි සහභාගී වීමට ඉඩප්‍රස්ථා ලැබෙන බවට සහතික විය යුතුය.

*ගුණාත්මක යෙදවුම්*

- 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව යමින්, ගුණාත්මක යෙදවුම් මගින් පාසල් යටිතල ව්‍යුහය දියුණු කරනු ලැබේ. පන්ති කාමරය, ක්‍රීඩා භූමිය සහ වැසිකිළි ඇතුළුව පාසල සියලු ළමුන්ට ප්‍රවේශ පහසුකම් ඇති ස්ථානයක් බවට පත් කිරීම පිළිබඳව එකී ගුණාත්මක යෙදවුම්වල දී සැලකිල්ලට ගත යුතුය. ආබාධ ඇති ළමුන්ගේ විශේෂිත ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය උපකරණ සහ වෙනත් පහසුකම් සැපයීම පිළිබඳව ද ගුණාත්මක යෙදවුම්වල දී සැලකිල්ලට ගත යුතු වේ.

*නේවාසික පහසුකම්*

- රජයේ සහ වෙනත් පාසල්වල නේවාසික පහසුකම් ඇති අවස්ථාවල දී, එම පහසුකම් සැලසීමේ දී ආබාධ ඇති ළමුන්ට ප්‍රමුඛතාවක් දිය යුතුය.

*උපකාර හා නියාමනය*

- තම පන්තියේ ආබාධ ඇති ළමයක සිටින පන්ති භාර ගුරුවරියගෙන් ආරම්භ වී, කලාප "අන්තර්කරණ" අධ්‍යාපන නිලධාරියා හරහා පළාතේ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂක සහ අධ්‍යාපන අමාත්‍යංශයේ අන්තර්කරණ අධ්‍යාපන ඒකකය දක්වා ව්‍යාප්ත වූ උපකාර හා නියාමන ක්‍රමයක් ආරම්භ කළ යුතුය.

*"විශේෂ අධ්‍යාපන ඒකක"*

- ළමුන් ප්‍රධාන ධාරාව සඳහා සූදානම් කිරීමේ අභිමතාර්ථය හැකි ප්‍රමාණයට සපුරා ගැනීම සඳහා, අන්තර්කරණ භාවිතය වඩාත් ශක්තිමත් කිරීමේ පරිසරයක් තුළ, විශේෂ අධ්‍යාපන ඒකක සමාලෝචනය කිරීම අවශ්‍ය වේ. මෙය පහසු කිරීම සඳහා මෙම ඒකකවල නම සහ දර්ශනය "අන්තර්කරණ අධ්‍යාපන ඒකක" වශයෙන් වෙනස් කරනු ලැබේ.

*"විශේෂ පාසල්"*

- රජයේ සහ පෞද්ගලික විශේෂ පාසල්වල අන්‍යෝන්‍ය ප්‍රයෝජනය සඳහා, එම පාසල් දෙවර්ගය අතර සම්බන්ධතා වර්ධනයකොට ඒවා ශක්තිමත් කළ යුතුය. පෞද්ගලික විශේෂ පාසල්වල දැනට සිටින ළමුන් බොහොමයක් ප්‍රධාන ධාරාවේ පන්ති කාමරවල සිටිය යුතුය. සාමාන්‍ය පන්ති කාමරයෙන් ප්‍රතිලාභයක් ලැබිය නොහැකි මෙම ළමුන්ට සේවයක් සැලසීමට විශේෂ පාසල්වලට හැකි වන පරිදි, රජය විසින් එම ළමුන් ප්‍රධාන ධාරාවට ඇතුල් කර ගැනීම සඳහා පහසුකම් සැලසීමේ කාර්ය භාරය ඉටු කරනු ලැබේ.

  මේ ආකාරයට සිය ආබාධිතබව නිසා ප්‍රධාන ධාරාවට සම්බන්ධවීම වැළැක්වීම හේතුකොටගෙන, අධ්‍යාපනයක් නොලබමින් නිවසේ දැනට සිටින ළමුන් විශාල සංඛ්‍යාවකට අධ්‍යාපන ඉඩප්‍රස්ථා ලැබෙනු ඇත. ප්‍රධාන ධාරාවට සම්බන්ධ කර ගත නොහැකි මෙම ළමුන්ගේ පවුල්වලට ගාස්තු ආදිය ගෙවිය නොහැකි වන අවස්ථාවල දී, එම තත්ත්වය සමනය කිරීම සඳහා යෝග්‍ය උපකාර කිරීමේ ක්‍රම රජය විසින් සොයා බලනු ඇත.

- තමනට වඩාත් ගැළපෙන අධ්‍යාපන ක්‍රමය තෝරා ගැනීමේ අයිතිය ආබාධ ඇති ළමුන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට ඇත.

*පොදු අධ්‍යාපනය*

- "විශේෂ" භාවිතාවන්ගෙන් "අන්තර්කරණ" භාවිතාවන්ට වෙනස්වීම අවධාරණය කරමින්, ආබාධ ඇති ළමුන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ඔවුනට සැලසිය හැකි අධ්‍යාපන ඉඩප්‍රස්ථාවල ගුණාත්මකබව සහ ප්‍රමාණය දියුණු කිරීම සඳහා, මෙම ප්‍රතිපත්තියෙහි නිර්දේශ කරන ලද වෙනස්කම්වලට පුළුල් ප්‍රචාරයක් දෙනු ලැබේ. ප්‍රචාරක ව්‍යාපාරයේ ප්‍රධාන අවධානය ආබාධ ඇති ළමුන්, වෙනත් පාසල් ළමුන් හා ඔවුන්ගේ දෙමාපියන් හා ප්‍රජාව කෙරෙහි යොමු කරනු ලැබේ.

## 5 නොවිධිමත් අධ්‍යාපනය

පාසල් අධ්‍යාපනය නිම නොකළ ආබාධ සහිත ගැහැණු සහ පිරිමි තරුණ පුද්ගලයන්ට නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්වලට සමාන ප්‍රවේශය ලැබිය හැකි වන අතර, එමගින් පෞද්ගලික සංවර්ධනයේ ඉහළම මට්ටම කරා ළඟා වීමට හා වෘත්තිගතභාවයට සූදානම් වීමට ඔවුනට ඉඩ ප්‍රස්ථා ලැබෙනු ඇත.

## 6 උසස් අධ්‍යාපනය

(1) ආබාධ ඇති තැනැත්තන් අවශ්‍ය ප්‍රවේශ නිර්ණායක සහ කොන්දේසි සපුරාලන්නේ නම්, එවැනි පුද්ගලයන් උසස් අධ්‍යාපනයේ දී වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවේ. ආබාධ ඇති ගැහැණු පිරිමි දෙපක්ෂයේ ම සිසුන් විශ්වවිද්‍යාලවලට සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට බඳවා ගනු ලැබේ.

එම ආයතන විසින් පහත සඳහන් දෑ ඉටු කිරීම මගින් මේ සඳහා පහසුකම් සලසනු ලැබේ.

- භෞතික ප්‍රවේශ පහසුකම් සහ සන්නිවේදනය සහ තොරතුරු ක්ෂේත්‍රවල විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට සන්නිවේදනය සහ තොරතුරුවලට ප්‍රවේශ පහසුකම් දියුණු කිරීමෙන්.

- ආබාධ ඇති සිසුන්ට ණය මුදල්, ශිෂ්‍යත්ව, ප්‍රදාන සහ වෙනත් ආකාරයේ මූල්‍ය උපකාර ලැබීමට හිමිකම් ඇති බව සහතික කිරීම හෝ විශේෂ ඉගෙනුම් ආධාරක (නිද. බ්‍රේල් උපකරණ සහ ද්‍රව්‍ය) ලබා ගැනීම සඳහා ඔවුනට උපකාර කිරීම මගින්.

- ආබාධ ඇති සිසුන් මුහුණ පෑ හැකි විශේෂිත ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාල උපදේශකයින් සූදානම් කිරීම.

- සුභසාධන වැඩසටහන්වල දී (නිද. නේවාසික පහසුකම් සැලසීම) ආබාධ ඇති සිසුන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීමෙන්.

(2) ආබාධ ඇති තැනැත්තන්ට උපකාර කිරීම සහ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා තමන් විසින් බිහි කරනු ලබන අදාල වෘත්තීයවේදීන්ගේ හැකියාව වැඩි කිරීමට විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන විසින් කටයුතු කරනු ඇත.

මෙය පහත සඳහන් ක්‍රමවලින් සපුරාගනු ලැබේ.

- අදාල විෂයමාලාවෙහි, නිද: වෛද්‍ය විද්‍යාව, මනෝ වෛද්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයන්හි ආබාධිතබව මොඩියුලයක් වශයෙන් ඇතුලත් කිරීම.

- ආබාධිතබව සම්බන්ධ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

## 7 සෞඛ්‍යය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය වන්නේ සියලු පුරවැසියන්ගේ ආයුෂ අපේක්ෂාව වැඩිකරලීම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි. සෞඛ්‍යමය ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම, රෝග සහ ආබාධ ඇතිවීම වැලැක්වීම, ආබාධ ඇති තැනැත්තන්ට සැලකිල්ල සහ පුනරුත්ථාපනය සැලසීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග වේ.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ.

- අදාල රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික අංශ ආයතන සහ ආබාධ ඇති තැනැත්තන්ගේ සංවිධාන සමග සම්බන්ධතා ගොඩනගා ශක්තිමත් කිරීම.

- ආබාධිතබව වැලැක්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ ප්‍රජාව මෙහෙයවීම සඳහා පහසුකම් සැලසීම.

- ආබාධිතබව සහ ආබාධ ඇති කරනු ලබන තත්ත්වයන් වැලැක්වීම, කලින් සොයා ගැනීම, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීම සඳහා, ඵලදායි වෛද්‍යමය මැදිහත්වීම් කිරීම, ආබාධ ඇති තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම සහ අවශ්‍ය යොමු කිරීම් හා උපදේශනය සැලසීම සහතික කිරීම.

- පුනරුත්ථාපනයේ සියලු මට්ටම්වල දී පුහුණුව ලැබූ ප්‍රමාණවත් සේවක පිරිසක් සිටින බවට සහතික කරලීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

- ආධාරක උපකරණ සැපයීම සහ යලිපදිංචිය ඇතුලු උපකාරක සේවා සහතික කරලීම සඳහා, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම.

- ආබාධ ඇති තැනැත්තන් සඳහා කලමණාකරණ තොරතුරු පද්ධතියක් ගොඩනැගීම.

- ප්‍රාදේශීය ජාලකරණයට පහසුකම් සැලසීම.

## 8 ක්‍රීඩා

ක්‍රීඩා චූකලී ආබාධ ඇති තැනැත්තන්ට ද (පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන්, පිරිමින් සහ කාන්තාවන්) අයත් වූවකි. ආබාධ ඇති තැනැත්තන් තමනට සමාන පුද්ගලයන් මෙන් විනෝද සහ තරගකාරි අරමුණු සඳහා තමන් කැමති ක්‍රීඩා ක්‍රියාකාරකමක සහභාගි වනු ඇත.

ක්‍රීඩා සම්බන්ධයෙන් වගකීම දරන රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන විසින්, පාසල් මට්ටමෙන් ආරම්භ කරමින් සහ පරිපාලනයේ සියලු මට්ටම් හරහා අඛණ්ඩව කරගෙන යමින් විශේෂයෙන් ම,

- ආබාධ ඇති තැනැත්තන්ගේ හැකියාවන් හඳුනා ගනිමින්, සියලු පොදු ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දී (රෝද පුටු භාවිත කරන්නන්ට ඉසව්, දෘශ්‍යාබාධ ඇති අය සඳහා ඉසව් වැනි) විශේෂ ආබාධ ඇති පුද්ගල කණ්ඩායම් සඳහා ඉසව් සංවිධානය කිරීම.

- ආබාධ ඇති තැනැත්තන්ට සහභාගිවිය හැකි වන පරිදි සහ පොදු ක්‍රීඩාවල ඔවුන් සඳහා (ශ්‍රවණාබාධ ඇති අයට මලල ක්‍රීඩා සහ දෘශ්‍යාබාධිත අයට ක්‍රිකට් වැනි) විශේෂ ඉසව් ඇතුලත් කිරීමට හැකි වන පරිදි, අවශ්‍ය අවස්ථාවන්හි දී දැනට පවතින ක්‍රීඩා රීති සහ ක්‍රමවේද යෝග්‍ය පරිදි වෙනස් කිරීම.

- ආබාධ ඇති තැනැත්තන්ට ක්‍රීඩා පිළිබඳ තම විශේෂ අභියෝග්‍යතාවන් වර්ධනය කර ගැනීමට ඉඩප්‍රස්ථා ලැබෙන පරිදි, පුහුණුව ඇතුලු සියලු පහසුකම්වලට ප්‍රවේශ පහසුකම් සැලසීම.

- අන්තර්ජාතික ඉසව්වලට සහභාගි වීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් කරා ළඟා වී ඇති ආබාධ ඇති තැනැත්තන් එම තරගවලට සහභාගිවීම සඳහා දිරිමත් කිරීම හා පහසුකම් ලබා දීම.

- පුහුණුකරුවන්, තරග විනිශ්චයකරුවන් හා පුහුණුකරන්නන් ඇතුලු ක්‍රීඩා නිලධාරීන්ගේ පුහුණු පාඨමාලාවේ මොඩියුලයක් වශයෙන් ආබාධිතබව ඇතුලත් කිරීම.

- යෝග්‍ය සුදුසුකම් ලත් ආබාධ ඇති තැනැත්තන් පුහුණුකරුවන්, තරග විනිශ්චයකරුවන් හා පුහුණුකරන්නන් සහ ක්‍රීඩා විද්‍යායතනවල කාර්ය මණ්ඩල වශයෙන් සේවයෙහි යෙදවීම ප්‍රවර්ධනය කිරීම.

- අදාල ක්‍රීඩා පර්යේෂණවල දී ආබාධ ඇති තැනැත්තන්ගේ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම.

(2) ඉහත දක්වා ඇති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, විවිධ ක්‍රීඩා පිළිබඳ ජාතික සම්මේලන වැනි ක්‍රීඩා සංවිධාන කරා ව්‍යාප්ත කෙරේ.

## 9 ප්‍රවාහනය

(1) ආබාධ ඇති තැනැත්තන්ට පොදු ප්‍රවාහන සේවා වඩාත් ප්‍රවේශ පහසුකම් සහිත වනු ඇත. ආබාධ ඇති තැනැත්තන්ට බස් රථ, දුම්රිය සහ ජල ප්‍රවාහන මගින් ගමන් කිරීමේ වැඩි නිදහසක් ලැබෙනු ඇත. ඔවුන්ට පාසල් සහ සේවා ස්ථාන කරා හා ඒවායේ සිට ගමන් කිරීමට හැකි වන අතර, තමන් කැමති විවිධ සමාජ, සංස්කෘතික, දේශපාලනික, ක්‍රීඩා සහ විනෝද කටයුතුවල සහභාගිවීමට හැකි වනු ඇත.

මෙය පහත සඳහන් උපාය මාර්ග මගින් කළ හැකි වනු ඇත.

- පොදු ප්‍රවාහන සේවා යොදා ගනු ලබන නව බස් රථ, මගී රථ, දුම්රිය මැදිරි, සහ වෙනත් වාහන මිළ දී ගැනීම සඳහා පිරිවිතර අවශ්‍යතා නියම කිරීමේ දී, ආබාධ ඇති තැනැත්තන්ගේ (විශේෂයෙන් චලන ආබාධ ඇති අයගේ) විශේෂ අවශ්‍යතා

(නිදː වශයෙන් පුලුල් දොර, අත්වාරු, පඩි පේලිවල උස, ප්‍රමාණවත් ඉඩකඩ) සැලකිල්ලට ගනු ලැබේ. මේ අයුරින් තුංවත් ක්‍රියාවලියක් ඍජුවේ පොදු ප්‍රවාහනයට ප්‍රවේශ පහසුකම් සලසා දෙනු ඇත. මෙය ගදිසියෙන් කල නොහැක්කේ බස් රථවල පිරිවිතර රටේ මාර්ගවල තත්ත්වයන්ට අදාල වන බැවිනි. (නිදසුනක් වශයෙන් මාර්ගවල ප්‍රමාණවත් ඉඩකඩ තිබීම.) එහෙයින් ඒවා ද සමාන්තරව දියුණු කරනු ලැබේ.

- දේශීය ඉංජිනේරුවන්ගේ සහ යෝග්‍ය තාක්ෂණ විශේෂඥයන්ගේ උපදෙස් පරිදි, දුම්රිය මැදිරිවලට ගොඩවීම සහ මැදිරිවලින් බැසීම සඳහා බෑවුම් මාර්ග භාවිත කිරිම වැනි, ආබාධ ඇති තැනැත්තන්ට පොදු ප්‍රවාහනවල ගමන් කිරිම පහසු කිරිම සඳහා සරල සහ නව ක්‍රම පරික්ෂාවට ලක්කොට වර්ධනය කරනු ලැබේ.

- ආබාධ ඇති තැනැත්තන්ට බස් නැවතුම්පලවල හා දුම්රිය ස්ථාන වඩාත් ප්‍රවේශ පහසුකම්වලින් (වැසිකිළි, බෑවුම් මාර්ග සහ සෝපාන ආදිය) සමන්විත වනු ඇත. මේවායේ සියලු නව ඉදිකිරිම්වල දී සමාජ සුභසාධන අමාත්‍යංශය විසින් සකසන ලද ප්‍රවේශ පහසුකම් සැලසීමේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගෙන, එම නව ඉදිකිරිම්වලට සම්පූර්ණයෙන් ප්‍රවේශ පහසුකම් සලසනු ඇත. හැකි ප්‍රමාණයට දැනට පවත්නා ගොඩනැගිලිවල වෙනස්කම් කරනු ලැබේ.

පොදු ප්‍රවාහන වාහන සහ නැවතුම් ප්‍රදේශ සඳහා යෝජිත ඉහත වෙනස්කම්, ආබාධ ඇති තැනැත්තන්ට පමණක් නොව වියපත් පුද්ගලයන් ඇතුලු අප ජනගහණයේ විශාල කොටසකට පවා විශාල වශයෙන් ප්‍රයෝජනවත් වනු ඇත.

(2) ආබාධ ඇති සමහර පුද්ගල කණ්ඩායම්වලට පමණක් දැනට ඇති ගමන් සහනාධාරය, දුගී රේඛාවෙන් පහල මට්ටමක ජිවත් වන සහ වෙනත් අය මෙන් නොව සිය ආබාධිතබව නිසා පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කිරිම දුෂ්කර වන වෙනත් පුද්ගලයන් ද ඇතුලත් වන පරිදි ව්‍යාප්ත කරනු ලැබේ.

(3) සිය ආබාධිතබව නිසා අධ්‍යාපනික හා පුහුණු ආයතනවලට සහ සේවා ස්ථානවලට ලගා වීම සඳහා පොදු ප්‍රවාහන සේවා භාවිත කල නොහැකි පුද්ගලයින් වෙත ද ආබාධ ඇති තැනැත්තන්ට දැනට ලැබෙන සුභසාධක ගෙවීම් ව්‍යාප්ත කරනු ලැබේ. එවැනි සුභසාධක ගෙවීම් සුලු ආකාරයකින් වුව ද පෞද්ගලික ප්‍රවාහන සේවා භාවිත කිරිමට ඔවුනට හැකියාව ලබා දීමට හේතු වනු ඇත.

(4) පොදු ප්‍රවාහන සේවා සම්බන්ධයෙන් වගකීම දරන රාජ්‍ය අංශය විසින්, සිය කලමණාකරණය, ආබාධිත බව පිලිබඳ සංවිධාන, පෞද්ගලික ප්‍රවාහන සමාගම්, වෘත්තීය සමිති සහ යෝග්‍ය තාක්ෂණ විශේෂඥයන් ආදීන්ගේ නියෝජනයක් සහිත වූ ඒකාබද්ධ කමිටුව වැනි තිරසාර පොදු වේදිකාවක් ස්ථාපිත කරනු ඇත. ආබාධ ඇති තැනැත්තන් වැඩි සංඛ්‍යාවකට පොදු සහ පෞද්ගලික ප්‍රවාහන සේවා භාවිත කල හැකි වන පරිදි, පොදු සහ පෞද්ගලික ප්‍රවාහන ක්‍රමවලට දැරිය හැකි සහ යෝග්‍ය වෙනස්කම් හඳුන්වා දිය හැකි ආකාරය පිලිබඳව, අදාල ප්‍රවාහන අධිකාරීන්ට උපදෙස් දීම මෙම පොදු වේදිකාවේ වගකීම වන්නේය. මෙම වගකීම පැවරිම මගින් අන්තර්ජාතික වර්ධනයන්ට අනුකූලව ආයතනය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(5) ගුවන් ගමන් සහ ගුවන් තොටුපලවල ප්‍රවේශ පහසුකම් අන්තර්ජාතික නියමයන්ට අනුකූල තිබිය යුතු අතර, සිදු වෙමින් පවත්නා වර්ධනයන්ට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. කෙසේ වුව ද අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලවීම අවශ්‍ය නොවන දේශීය ගුවන් යානා සහ දේශීය ගුවන් තොටුපලවල් තිබේ නම්, එවිට මෙම පත්‍රිකාවෙහි දක්වා ඇති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ඒවාට ද සමාන ලෙස අදාළ වේ.

## 10 නිවාස

ආබාධ ඇති පුද්ගලයින් සතුව දැනට ඇති නිවාස, සාමාන්‍ය ජනගහනයට වඩා ගුණාත්මක බවින් සැහෙන පමණ දුර්වල මට්ටමේ ඒවා වේ. නිවාස ණය යෝජනා ක්‍රමවලට සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් වන ඉඩම් හිමිකම ඇත්තේ ස්වල්ප දෙනෙකුට පමණි. මෙම ක්ෂේත්‍රයේ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් සහිත නිවාස සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීම සඳහා, අවශ්‍ය එහෙත් කාල සීමාවක් ඇති සහනශීලී පියවර ගනු ලැබේ.

මේ සඳහා,

- ණය මුදල් සහ ප්‍රදාන යැපයීම මගින් නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස, රජයේ මුදල් වෙන් කිරීම් ලබා ගන්නා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි අධිකාරීන්, තම ප්‍රතිලාභීන් වශයෙන් ආබාධ ඇති තැනැත්තන්ගෙන් සාධාරණ ප්‍රමාණයක් ඇතුලත් කරනු ඇත.

- ඉඩම් බෙදා දීම පිළිබඳ වගකීම දරන අධිකාරීන් විසින්, ඕනෑම වැඩසටහනක දී ඉඩම් නොමැති ආබාධ ඇති තැනැත්තන් සාධාරණ ප්‍රමාණයකට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

- ඉඩම් නොමැති ආබාධ ඇති පුද්ගලයනට ණය මුදල් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම පිණිස, නිවාස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ මුදල් වෙන් කිරීම් ලබා ගන්නා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි අධිකාරීන් විසින්, සිය මුදල් වෙන්කිරීම්වලින් සාධාරණ ප්‍රමාණයක් එවැනි පුද්ගලයන්ට ඉඩම් මිළ දී ගැනීම සඳහා වෙන් කරනු ඇත.

- වාසස්ථාන ඉදි කරන, සියලු රාජ්‍ය අනුග්‍රහ ලබන සහ පෞද්ගලික අංශ වැඩසටහන් විසින්, ප්‍රවේශ පහසුකම් සහිත නිවාස සාධාරණ ප්‍රමාණයක් ඉදිකොට, ප්‍රමුඛතා පදනමක් සහිතව ආබාධ ඇති තැනැත්තන්ට ඒවා මිළ දී ගැනීමට ඉඩකඩ සලසනු ලැබේ.

- දැනට පවත්නා නිවාස යෝග්‍ය පරිදි සකස් ගැනීම පිණිස, ණය මුදල් ප්‍රදාන සහ සහනාධාර හෝ බදු නිදහස් කිරීම් හැකි අවස්ථාවල දී ලබා දෙනු ලැබේ.

## 11 සමාජ ආරක්ෂණය

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ලබා ගත හැකි විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රම ඇතුලු සමාජ ආරක්ෂණය, සාධාරණ පදනමක් මත ආබාධ ඇති තැනැත්තන්ට ද ලබා දෙනු ඇත.

(2) ආර්ථික වශයෙන් ස්වාධීන වීම සඳහා සමහර පුද්ගලයන්ට (දරුණු මානසික ආබාධ, බරපතල මානසික ඖන්දග්‍රාමීබව සහ බහුවිධ ආබාධිතබව වැනි) ආබාධිත බව බරපතල වන අවස්ථාවල දී, එම පුද්ගලයන්ට සාධාරණ ගුණාත්මක ජීවන තත්ත්වයක් සහතික කරලීම සඳහා ප්‍රමාණවත් සමාජ ආරක්ෂණ පියවර ගනු ලැබේ.

## 12 ගොඩනැගූ පරිසරයට ප්‍රවේශය සහ ප්‍රවේශ පහසුකම් සහිත සංචාරක ව්‍යාපාරය

(1) ආබාධ ඇති තැනැත්තන්ට, විශේෂයෙන් රෝද පුටු පාවිච්චි කරන්නන්ට සහ පෙනීම නොමැති අයට ගමන් කිරීමේ වැඩි නිදහසක් ලැබෙන අතර පොදු ගොඩනැගිලිවලට ප්‍රවේශ පහසුකම්, බාධකවලින් තොර ගමන් මාර්ග, උද්‍යාන, විවේකාගාර, සෝපාන සහ පඩි පේළි හා වෙනත් පහසුකම් මගින්, වැඩි සේවාවන් භාවිත කිරීමට හැකි වනු ඇත. සමාජ සුභසාධන අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන ආබාධ ඇති තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් පිළිබඳ නියෝගවලට අනුකූලව මේවා ඉදි කිරීම සහ යෝග්‍ය ලෙස සකස් කිරීම සිදු වනු ඇත. මාර්ගෝපදේශ කලින් කලට සමාලෝචනය කිරීම සහ යාවත්කාල කිරීම කරනු ලැබේ.

ගොඩනැගූ පරිසරයට ප්‍රවේශ පහසුකම් සැලසීම දියුණු කිරීම සඳහා උපාය මාර්ගවලට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- සියලු දෙනාගේ, විශේෂයෙන් රෝද පුටු භාවිත කරන්නන්ගේ හා දෘශ්‍යාබාධිත අයගේ ආරක්ෂාව සහ ස්වාධීන බව උදෙසා බාධකවලින් තොර ගමන් මාර්ග සැලසුම් කිරීම සහ සැකසීම.
- සියලු දෙනාට, විශේෂයෙන් රෝද පුටු භාවිත කරන්නන්ට හා දෘශ්‍යාබාධිත අයට ප්‍රවේශ පහසුකම් තිබෙන පරිදි පොදු ගොඩනැගිලි සැලසුම් කිරීම සහ යෝග්‍ය පරිදි සකස් කිරීම.

  ප්‍රවේශ පහසුකම් සහිත අවශ්‍යතාවලට අනුකූල විය යුතු ගොඩනැගිලි වූ කලී, රජයේ ස්ථාන සහ ආයතන, කාර්යාල ගොඩනැගිලි, නේවාසික ගොඩනැගිලි, වාණිජ ගොඩනැගිලි, සෞඛ්‍ය ස්ථාන, අධ්‍යාපනික ආයතන, පුහුණු කිරීමේ ආයතන, පුස්තකාල, අවන්හල්, හෝටල්, විනෝද ස්ථාන, ක්‍රීඩා ස්ථාන, සහ ආගමික ගොඩනැගිලි ඇතුළත් සියලු නව ගොඩනැගිලි වේ. බැංකු, වෙළඳ සැල්, නැවතුම් ප්‍රදේශ, සංක්‍රමණ ප්‍රදේශ, රේගු ප්‍රදේශ, ගමන් බඩු ශාලා, වෙන් කිරීමේ ශාලා, විමසීම් කාර්යාල සහ සාමාන්‍ය ජනයා විසින් භාවිත කරන වෙනත් ගොඩනැගිලි වර්ග වැනි සියලු පොදු ප්‍රදේශ ද ඇතුළත් වේ.